## 2022 ජනවාරි මස 06 වන දින පෙරවරු 9.30 ට මොරටුව මහා නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මොරටුව මහා නගර සභාවේ මාසික සභා රැස්වීමේ වාර්තාව

**සහභාගීත්වය:-**

| | | | |
|---|---|---|---|
| 01. | නගරාධිපති | - | ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 02. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී. සමන්ත සිල්වා මහතා |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී. එම්. සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා |
| 05. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 06. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්. ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 07. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 08. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා |
| 09. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ඩබ්. ඩී. රන්දු නිරෝෂණ මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. එම්. මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්. ඩබ්. එම්. නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ. ඩී. අනුර ප්‍රනාන්දු මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. ලලිත් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්. බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එෆ්. බී. නිලංක සිල්වා මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. කේ. පී. සුසන්ත පෙරේරා මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. කුමාර රාජරත්න මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. පිලිප් ෆැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. බී. මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්. උජිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ. දීපා චාන්දනී ආරියවංශ මහත්මිය |
| 27. | මහා නගර සභා මන්ත්‍රී | - | රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා |
| 28. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. මැක්සි ජේ ප්‍රනාන්දු මහතා |
| 29. | මහා නගර සභා මන්ත්‍රී | - | සුනිල් නන්දසිරි මාසකෝරාල මහතා |
| 30. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. සජිත් දුමින්ද පීරිස් මහතා |
| 31. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිසර රසාංජන මෙන්ඩිස් මහතා |
| 32. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 33. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍ර ගාමිණී පීරිස් මහතා |
| 34. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 35. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්. එම්. ඒ. දෝන දිලාශිනී මහත්මිය |
| 36. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 37. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී. එම්. නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා |
| 38. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. සුදර්ශනි ප්‍රියන්ත්‍රිකා කුරේ මහත්මිය |
| 39. | මහා නගර සභා මන්ත්‍රී | - | මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |

| | | | |
|---|---|---|---|
| 40. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 41. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 42. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය |
| 43. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්. ක්‍රිෂනි ප්‍රනාන්දු මහත්මිය |
| 44. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 45. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. පී. ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය |
| 46. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ. එච්. සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 47. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |

සහ

| | | |
|---|---|---|
| නාගරික ලේකම් (වැ.බ.) | - | එම්. කේ. ඩී. තාරක මුණසිංහ මහතා |

ගරු නගරාධිපතිතුමාගේ ආරාධනය මත වැඩ බලන නාගරික ලේකම් එම්. කේ. ඩී. තාරක මුණසිංහ මහතා විසින් 2022.01.06 වන දින මාසික සභා රැස්වීමේ නිවේදනය සභාවට ඉදිරිපත් කරන ලදි.

## 01. වාර්තාව පිළිගැනිම හා සළකා බැලීම.

01(1) 2021.11.26 දින පැවති විශේෂ මහා සභා වාර්තාව.

**<u>මහා නගර සභා මන්ත්‍රී, එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, 2021.11.26 දින පැවති විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව මා පිළිගත යුතුයැයි මා යෝජනා කර සිටිනවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - ජී. එම්. නිරෝෂන් රුවමාල් අපොන්සු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මගේ කථාව 41 වෙනි පිටුවේ හා 42 වෙනි පිටුවේ තියෙනවා. මම අවසානයේ කියපු ටික මේකේ වැදිලා නෑ. එය සංශෝධනය කරන මෙන් ඉල්ලා සිටිනවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, මගේ කථාවේ 28 වෙනි පිටුවේ යම් කිසි දෝෂ ටිකක් තියෙනවා. එ ටික හදන්න පුලුවන්නම් 28 වෙනි පිටුවේ ඉහල සිට 4 වෙනි පේළිය එතන 269 කියන තැන මිලියන කියලා ඇතුලත්විය යුතුයි. ඉහල සිට 8 වෙනි පේළිය එතන එ වචනය සාක්ෂාත් ලෙස නිවැරදි විය යුතුයි. ඉහල සිට 13 වෙනි පේළිය ගිය වර 2.3 කියන තැන බිලියන 2.3 ඇස්තමේන්තු කර ඇත යනුවෙන් නිවැරදි විය යුතුයි. 15 වෙනි පේළියේ සියයට 28 තැන ඉදිරියෙන් ආදායම ලෙස සඳහන් විය යුතුයි.

**<u>මහ නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, වාර්තාවේ 39 වෙනි පිටුවේ අවසාන වශයෙන් මගේ කථාවේ මොරටුව ජනතාව වෙනුවෙන් සංවර්ධන කටයුතු ප්‍රමුඛතාවය හදුනාගෙන කටයුතු කරන්න පොරොන්දු

වෙමින් කියලා තියෙන්නේ. අපිට පොරොන්දු වෙන්න බැනේ එ නිසා කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිමින් විධිටයට වෙනස්වෙන්න ඕන. 39 වෙනි පිටුවේ මගේ කථාවේ අන්තිම කොටස සි සි ත්‍රි මට්ටමින් ඩි මට්ටමට වැටෙන් නැතිව අනාගතයේදි මොරටුව ජනතාව වෙනුවෙන් සංවර්ධන කටයුතු ප්‍රමුඛතාවය හදුනාගෙන කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමින් නිහඩ වෙනවා කියලා තියෙන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - එස්. බේසර රවින්ද්‍ර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මා විසින් ප්‍රශාකයක් කරනවා 29 වෙනි පිටුවේ තියෙන්නේ ආදාහනාගාර සම්බන්ධව එකෙදි මම කියලා තියෙනවා අසනිපයෙන් අම්මා සිටියේ රෝහලේ. මම කිව්වා අම්මා මියගියහොත් මට එ වේදනාව දරා ගන්න පුලුවන් කියලා. නමුත් මේකේ සදහන් වෙලා තියෙනවා අම්මා මිය ගිය වේදනාව දරාගන්න පුලුවන් කියලා 02 වෙනිදා වෙනකොට මගේ අම්මා මිය ගිහිල්ලා නැහැ. එක නිවැරදි කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. එතකොට අම්මා අසනිපයෙන් රෝහල්ගතව සිටියේ.

මහා නගර සභා මන්ත්‍රී ජී. එම්. සුරංග එන්. අපෝන්සු මහතා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව 2021.11.26 දින පැවති විශේෂ මහා සභා වාර්තාව සංශෝධන සහිතව ඒකමතිකව සභා සම්මත විය.

01(2) 2021.12.02 දින පැවති මාසික සභා වාර්තාව.

<u>මහා නගර සභා මන්ත්‍රී, එල්. ඔසද හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2021.12.02 දින පැවති මාසික සභා වාර්තාව පිළිගතයුතු යැයි මා සභාවට යෝජනා කර සිටිනවා.

මහා නගර සභා මන්ත්‍රී ජී. එම්. සුරංග එන්. අපෝන්සු මහතා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව 2021.12.02 දින පැවති මාසික සභා වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

## 02 <u>ගරු නගරාධිපතිතුමාගේ නිවේදන</u>

### 2(1) <u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, මේ අවුරුද්ද ආරම්භයත් සමගම ආයවනා හා පෙත්සම් සභාව හමුවේ තැබිමේදි විශේෂයෙන්ම වරින් වර නැගිටින්නේ නැතිව වාචිකව පිළිතුරු සැපයිමෙන් තොරව විශේෂයෙන්ම අදාල වෙන්නාවු ආයාවනා පෙත්සම් කෙටියෙන් සභාවට දැනුවත් කිරිම සිදු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනවා.

එවගේම විශේෂයෙන්ම අද දිනයෙදි සභාගර්භය තුල විශේෂිත ඡායාරූප 5ක් දර්ශනය වෙලා තියෙනවා. පළමු සභාපතිතුමාගෙත් ඊළගට පළමු නගරාධිපතිතුමා ඊට පස්සේ දෙවෙනි නගරාධිපතිතුමා, තුන්වෙනි නගරාධිපතිතුමා, වර්තමානයේ ඉන්න නගරාධිපතිතුමා විධියට ඡායාරූප 5ක් සභාගර්භයේ ප්‍රදර්ශණය කර තිබෙනවා. සභාවට ඉදිරිපත්කරන ජනතාවගේ ආයවනා හා පෙත්සම් පැමිණිලි සභාව හමුවේ තැබිමේදි තමන්ට තියෙන්නේ හතරද පහද

එකවර ඉදිරිපත් කරන්න. නැගිට නැගිට ඉදිරිපත් කිරිමෙන් වළකින්න. ආණ්ඩු පක්ෂයත් විපක්ෂයත් ආණ්ඩු පක්ෂය ඉදිරිපත් කරන දෙයකට විපක්ෂය නැවතත් නැගිටලා එකට පිළිතුරු කථාවක් නොකරන්නත් විපක්ෂයේ කවුරුහෝ ආණ්ඩු පක්ෂයට එයට පිළිතුරු ලෙස ආයවනා හා පෙත්සම් පැමිණිලි ඉදිරිපත් නොකිරිමත් කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනවා.

## 03 <u>සභාව අමතා එවන ලද ආයවනා හා පෙත්සම් පැමිණිලි හා සන්දේශ සභාව හමුවේ තැබිම.</u>

### 03(1) <u>මහ නගර සභා මන්ත්‍රි - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ආයවනා පෙත්සම් පැමිණිලි යටතේ අවුරුද්දේ මුල පලවෙනියෙන්ම මට පැමිණිල්ලක් කිරිමට ලැබිම ඇත්තටම කණගාටු වෙනවා. නමුත්, මේ පැමිණිල්ල කරන්න ඔනේ මං වෙනුවෙන් විතරක් නෙමෙයි ඔබතුමා වගේ මහජන නියෝජිතයෝ අපි හැමෝම වෙනුවෙන්. ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා පවා පසුගිය සභාවක ඉදිරිපත් කළා. බොරුපන පෙර පාසලත්, මාතෘ ළමා සායනයත් සංවර්ධන කටයුතු සඳහා පළාත් සභාවේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් ලක්ෂ 11 කුත් ගරු විමල් විරවංශ ඇමතිතුමාගේ විමධ්‍යගත අරමුදලෙන් ලක්ෂ 7 කුත් ලක්ෂ 18ක් ඇවිල්ලා තියෙනවා. ඒ තුල අපිට එම පෙර පාසලේ හා මාතෘ ළමා සායනයේ සියලු අඩුපාඩුකම් සකසන්න පුලුවන් කියලා ඔබතුමාත් ප්‍රකාශ කලා මමත් මේ සභාවේ ප්‍රකාශ කරා. ගරු නගරාධිපතිතුමනි, එ අනුව කොන්ත්‍රාත් කරුවන් දෙදෙනෙක් ටෙන්ඩර් එකකින් එම ව්‍යාපෘති දෙකම නිමකරන්න ලබාගෙන තිබුණා. ගරු නගරාධිපතිතුමනි, එක කොන්ත්‍රාත්කරුවෙක් මේ අවසන් මොහොත වෙනකොට එය කරන්න බැහැයි කියලා ලියුමක් දිලා තියෙනවා. තව කොන්ත්‍රාත්කරුවෙක් විමධ්‍යගත ලක්ෂ 7 යෝජනාවේ භාගයක් කරලා නිහඩ වෙලා තියෙනවා. ගරු නගරාධිපතිතුමනි, මේ සම්බන්ධයෙන් ඔබතුමාට මම සැලකලාට පස්සේ ඔබතුමා ඉතාමත් නිවැරදි හා ඍජු තිරණයක් ගත්තා. මොකද මේ මහජන මුදල් සභාවේ මුදලක් ඒ විධියට ප්‍රමාද වෙනවා නම් අපිට එක ඊලග පාර දෙන්න පුලුවන් නමුත් මේවා ගිය අවුරුද්දේ 31 වෙනකොට මේ මුදල් ආපහු යනවා. මේ සභාවට මේ මොරටුවේ ජනතාවට වැඩ කරන්න ආපු මුදල් ආපහු යනවා. ඔබතුමා නිවැරදිම තිරණයක් ගත්තා එ සම්බන්ධයෙන් ඔබතුමාට හිස නමා ආචාර කරනවා. අදාල කොන්ත්‍රාත්කරුවන් දෙදෙනාම ආසාදු ලේඛනයට ඇතුලත්කරා. එක ඉතාමත් යහපත්. ඉදිරියේදි එ විධියට මහජන මුදල් ආපස්සට හරවා යවන්න හෝ නාස්තිකරන්න කවුරුහෝ කොන්ත්‍රාත්කරුවෙක් සැදි පැහැදි සිටිනවා නම් ඔවුන්ට නැවත වතාවක් දෙපාරක් තුන්පාරක් නෙමෙයි සියපාරක් හිතන්න පුලුවන් වෙන විධියේ තින්දුවක් ඔබතුමා ගත්තා. එකට මගේ ස්තුතිය. ගරු නගරාධිපතිතුමනි, මට මේ විවේචනය තියෙනවා අපේ ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුතුමිය හා ඉංජිනේරුතුමාට. දැන් අපි දන්නවා සාමාන්‍යයෙන් ගරු නගරාධිපතිතුමනි, ව්‍යාපෘතියක් ආවාට පස්සේ එක ටෙන්ඩර් කරාට පස්සේ දැන් මේවෙනකොට ලක්ෂ තුනාමාරක බිලක් දාලා තියෙනවා ලක්ෂ 7 ක වැඩ කින් ලක්ෂ තුනාමාරක බිලක් යවලා තියෙනවා. ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට.එ ලක්ෂ තුනාමාරක එයා වැඩකරලා තියෙනවාලු. මොනාද කරලා තියෙන වැඩේ. තාප්පේ තියෙනවා පෙර පාසලේ තාප්පේ උඩ කණුවක් ගහලා තියෙනවා ඕක තමයි වැඩේ. ගරු නගරාධිපතිතුමනි, ඉතාමත් කණගාටුයි කියන්න. මාතෘ ළමා සායනයට සිවිලිම් ෆැන් එකක් සිවිලිම් ෆැන් එකක් මම දන්න විධියට රු5000.00ක් වෙයි වැඩිම වුනොත් හත් අට දාහක් වෙයි. හොදම එකක් ඌෂාවගේ එකක් එහෙම මුදලක් වියදම් කරලා සිවිලිම් ෆැන් එකක් දාන්න බැරි

කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි වෙලා තියෙන්නේ මොකටද කියන එක අපිට ප්‍රශ්ණයක්. මේක අටකලන්පන්න ප්‍රාදේශිය සභාව නම් හිත හදාගන්න පුලුවන් මේක මොරටුව මහා නගර සභාව ඔබතුමාලා අපි මේ සභාව තුල වැඩ කරනවා. සභාවට පිටන් එන මුදල් වලින් වැඩ කරනවා. හැබැයි ප්‍රශ්ණේ තියෙන්නේ නගරාධිපතිතුමනි, අපේ සභාවේ අරමුදල් වලින් වැඩ කරනකොට එක අපිට බේරගන්න පුලුවන් නමුත් පිටස්තර විමධ්‍යගත වෙන්න පුලුවන්, පළාත් සභාවෙන් එන්න පුලුවන් එ වගේ වෙනත් ආයතන වලින් ආවාම 31 න් මුදල් යනවා.එතකොට අපි කරන්න ඕනේ එ මුදල් ආපහු යවන එකද තියෙන එ මුදල් නැවත මේ සභාව තුල ප්‍රයෝජනයට ගන්න පුලුවන් ආකාරයට කටයුතු කරන එකද. මුදල් යවනවා කියන්නේ ගරු නගරාධිපතිතුමනි, සභාවක් විදියට ඉංජිනේරු දෙපාර්තමේන්තුව ලැජ්ජාවෙන්න ඕන. තමන්ට වැඩ කරන්න ඕන මුදල් ආපහු හරවලා යවනවා ලැජ්ජවෙන්න ඕන. ගරු නගරාධිපතිතුමනි, 31ක ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් මට කථා කරලා කිව්වා ගරු මන්ත්‍රිතුමා මේ මුදලට අදාල බිල් ටික දාන්න. මොකද තව ව්‍යාපෘති 7 ක්. 7කට බිල් දාලා තිබ්බා. සමහර ව්‍යාපෘතිවලට අතවත් තියලා තිබ්බේ නෑ. මම එ ගැන වැරැද්දක් දකින්නේ නෑ. මොකද සභාවට සල්ලි ටික ගත්තාට පස්සේ එ අදාල කොන්ත්‍රාත් කාරයාට සල්ලි දෙන්නේ වැඩ කරාට පස්සේ. නමුත් සල්ලි යන එක වළක්වලා සභාවට සල්ලි ගන්නවා කියන එක වැරදි නෑ. එක හරි හැබැයි විමල් විරවංශ ඇමතිතුමාගේ ව්‍යාපෘතියට විතරක් එ අසාධාරණය වුනේ කොහොමද කියන එක මට ප්‍රශ්ණයක්. ලක්ෂ තුනාමාරක බිල දාලා යැව්වා ලක්ෂ හතේ වැඩේට. එක එහෙම වුනේ කොහොමද කියන එක මට ප්‍රශ්ණයක්. ගරු නගරාධිපතිතුමනි, මම 31 හිටියා කාර් පාර්ක් එකේ වෙළදාම් කරගෙන ටිෂර්ට් එකක් ඇදගෙන හිටියේ මෙහෙම කිට් එකක් ඇදගෙන නෙමේයි හිටියේ මං ආවා අපේ ඉංජිනේරු මහත්තයා ඇත්තටම එතුමානම් සැලකියයුතු මහන්සියක් දැරුවා. මම ඇස් දෙකෙන් දැක්කා. ඉංජිනේරුතුමිය ලගට ආවා මම දිහා එතුමිය බැලුවේ නිකන් උරුලැවෙක් දිහා බලනවා වගේ මොකද මම හිටිය විධියට. ඒකට කමක් නෑ ගරු නගරාධිපතිතුමනි, හැබැයි අපේ ඉංජිනේරු මහත්තයත් පොරොන්දු වුනා මන්ත්‍රිතුමා මේ සල්ලි ටික ආපහු අපි බිල අලුතින් දාලා එවැඩෙ කරමු කියලා. දැන් මට තියෙන ප්‍රශ්ණය තමයි ව්‍යාපෘති 07 ක සල්ලි වැඩ නොකරත් එක මේ සභාවට ගන්න බිල් දාලා තියෙද්දි මේක මෙහෙම කරේ ඇයි කියන එක මට ප්‍රශ්ණයක්. එවගේම ගරු නගරාධිපතිතුමනි, ඉතාමත් කණගාටුදායක තත්වය අපි කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධයෙන් කටයුතු කරද්දි වැඩ කරන්න බැරි නම් එ කොන්ත්‍රාත්කරුවන්ට වගකිමක් තියෙනවා ඔබතුමා මේක නිවැරදිව හදුන ගත්තා. සාමාන්‍යයෙන් ගරු නගරාධිපතිතුමා, ආයතනයකට හො සැපයුම් කවුරු හරි කරනවානම් අපි හිතමු කවුරු හරි එළවලු සපයන්න හෝටලයකට ගලදාරි කියන්නකො ගිවිසුමේ තියෙනවා. එයා සපයන එළවලු, වම්බටු කිලෝ 01 ක් රු සියයනම් වම්බටු කිලෝ 01 රු.10.00 ට තොග මිල දැම්මත් සියයට දෙන්න ඕනේ. වම්බටු කිලෝ 01 රු.120.00 වුනත් රු.100.00 යට දෙන්න ඕන. එක තමයි සැපයුමක තියෙන්නේ. ලාභ ලබන්නත් පුලුවන් නමුත් සමහර අවස්ථාවල ප්‍රශ්ණ එනවානම් එවා වෙනම විසදගන්න ඕන. නමුත් මේ වගේ අවස්ථාවක මුදල් ආපසු යවන තැනක එක පාර ලියුමක් දෙනවානම් කරන්න බැහැ කියලා සති දෙකක් තුනත් තියාගෙන එතකොට මොකද වෙන්නේ. එ නිසා ගරු නගරාධිපතිතුමනි, මගේ බරපතල විරෝධය ඉංජිනේරුතුමියටත් එල්ල කරනවා.

මේ අවස්ථාවේ මගේ බරපතල විවේචනය නගරාධිපතිතුමනි, අපි ජනතාවට වගකියන මිනිස්සු. අද මේ වෙනකොට බොරුපන පෙර පාසලේ කලින් ළමයි දහයයි දොලහයි හිටියේ. මේක හදනවා කියලා දැනගත්තාට පස්සේ 20 කට වැඩිය අද ඇවිල්ලා තියෙනවා. අද ඉඩ නැති

තත්වයකට පත්වෙලා තියෙනවා. තව ඇප්ලිකේෂන් 10ක් 15 ක් ගෙනහිල්ලා තියෙනවා. විශේෂ අවශ්‍යතා සහිත දරුවෙක් දැන් එතන ඉන්නවා. ඒ දරුවා දැන් අනෙක් දරුවන් එක්ක එකට කටයුතු කරද්දි දරුවාගේ තියෙන සමහර රෝග ලක්ෂණ පහවෙමින් තියෙනවා. එහෙම තත්වයක් එ පෙර පාසලේ තියෙන්නේ. එහෙම තියෙන පෙර පාසලකට මෙහෙම කරන එක යුක්ති සහගතද අපේ ඉංජිනේරු දෙපාර්තමේන්තුව එනිසා මම අවසානේ කියනවා ගරු නගරාධිපතිතුමනි, අපි මහජනතාවට වගකියන්න ඕන. අපිට බී. එස්. සි නැහැ. ඔබතුමාටත් නෑ. මටත් නෑ. මෙතන ඉන්න ගොඩක් අයට නෑ. අපිට තියෙනවා එම්. එස්. පි කියන උපාධිය ඔබතුමාටත් තියෙනවා. මටත් තියෙනවා. මහජන සේවය පිණිසයි. ඒ නිසා අපිට ඒ ගෞරවය වගේම අපේ මහජනතාවගේ මුදල් එක්ක සෙල්ලම් කරන්න එපා. අපි සියලු නිළධාරින්ට මේ අවස්ථාවේ කියමින් මගේ කණගාටුව වගේම මගේ විරෝධය පල කරනවා විමල් විරවංශ ඇමතිතුමාගේ මුදලක් ලක්ෂ 11 මුදලක් ආපහු යැවීම සම්බන්ධව කටයුතු කරපු සියලු දෙනාට මගේ විරෝධය පලකරනවා.

<u>නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිවරුනි, සමාවෙන්න මෙතුමා ගොඩක් දෙවල් කියන්න ගිහිල්ලා අවශ්‍ය දෙය කියවුනේ නෑ. එයට ආසාධාරණයක් නොවෙන්න කොන්ත්‍රාත්කරුවන් දෙදෙනාගෙන්ම එ ප්‍රතිපාදනය වෙන් කරපු තැනට ආසාධාරණයක් නොවෙන්න මේ වෙනකොට කොන්ත්‍රාත් එක කරපු නැති කෙනාගේ තවත් කොන්ත්‍රාත් කරපු මුදල් නොගෙවන්නටත් ඒ මුදල ඊලග කොන්ත්‍රාත්කරුවාගෙන් අයකරගෙන කරන්න ඔහු කරන්න ඕන නැත්නම් අයකරගන්නටත් තමයි මම තිරණය දුන්නේ. එකතමයි වැදගත්ම කාරණය. මම කලේ අසාධාරණයක් නොවෙන්න කලයුතු හොදම දේ කලේ. ඔවුන්ව අසාදු ලේඛනගත කරන එක මහලොකු දෙයක් නෙමෙයි. නමුත් අරක කරන්න බෑ. නිතියත් ගැටගහගෙන කරන්න පුලුවන් දෙය කරා. එක්කො ඔයා ලක්ෂ 11 කරන්න ඔන අතින් දාලා එහෙම නැත්නම් එයාගේ මුදල්වලින් කපන්න මොකද කොන්ත්‍රාත් එකක් අරගෙන තියෙනවා. අපිත් එක්ක ගිවිසුම්ගත වෙලා තියෙනවා. ඒ තිරණය මම ගත්තා. තීරණය කලේ ඔය කියන විමල්විරවංශ ඇමතිතුමාටවත් පළාත් සභාවටත් හානියක් නොවෙන්න. කරන්න බැරි ඒවා වේලාසනින් යැව්වා. කරන්න ඕනේ නෑ කරන්න බැහැ කියලා අනෙක් එවා මම හිතන්නේ අසාධාරණයක් නොවෙන්න කටයුතු කරා.

**03(2)** <u>මහ නගර සභා මන්ත්‍රි - එච්. ප්‍රදී ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ආයවනා හා පෙත්සම් යටතේ මුලින්ම මම මතක් කරන්නට ඕන අපේ මොරටුව මහා නගර සභාවේ නාගරික මන්ත්‍රි ජයමාල් ශ්‍රියාරත්න මන්ත්‍රිතුමාගේ ආදරණිය මෑණියන්ගේ අභාවය සිදු වුනා පහුගිය දිනෙක. එවගේම සුනිල් නන්දසිරි මාසකෝරාල මන්ත්‍රිතුමාගේ සහෝදරයා තිලක් මාසකෝරාල මහතාගේ අභාවයත් සිදුවුනා. මේ සභාව වෙනුවෙන් අපේ ශෝකය මේ අවස්ථාවේදි සියලුදෙනා වෙනුවෙන්ම ප්‍රකාශ කරන්න මේ අවස්ථාවක් කර ගන්නවා.

**03(3)** <u>මහ නගර සභා මන්ත්‍රි - එච්. ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ආයවනා හා පෙත්සම් යටතේ මේ නව වසරේ මුලින්ම ප්‍රසාදය පල කිරිමේ අවස්ථාවක් කර ගන්නවා. ගරු නගරාධිපතිතුමනි, මොරටු ජනතාව විධියටත් මේ සභාව විධියටත් නිරන්තරයෙන් අපේ කථාබහට ලක්වෙච්ච කාරණයක් තමයි මොරටු පුරවරයේ මත්ද්‍රව්‍ය ජාවාරම පිළිබදව ගරු නගරාධිපතිතුමනි කියන්න සංතෝශයි මොරටුව පොලිස් බල

ප්‍රදේශය තුල තමන් රාජකාරි භාරගෙන මාසයක් යන්න පෙර වර්තමාන මුලස්ථාන පොලිස් පරික්ෂක පුෂ්පකුමාර ප්‍රදිනාන්දු මහත්මා විශාල වැටලීමක් කරලා අයිස් කිලෝවක් වගේ ප්‍රමාණයක් අත්අඩංගුවට අරගෙන ලොකු කාර්යභාරයක් ඉටුකරා. විශේෂයෙන්ම මොරටුවේ ඉපදිලා මොරටුවේ හැදිලා වැඩිලා මොරටුවේ අධ්‍යාපනය ලබලා අද මොරටුවේ මුලස්ථාන පොලිස් පරික්ෂක විදියට පත්වෙලා මාසයක් යන්නට කලියෙන් එ උවදුර තේරුම් අරගෙන එකට කටයුතු කිරිම පිළිබදව මොරටුව මහා නගර සභාව විදියට අපි එතුමන්ට සභාවේ ප්‍රසාදය පලකරන්නට අපි මෙය අවස්ථාවක් කර ගන්නවා.

**03(4)** <u>මහ නගර සභා මන්ත්‍රී - එච්. ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, විශේෂයෙන්ම මගේ ඊළග පැමිණිල්ල තමයි අපි ජීවත්වෙන මොරටුව දකුණ ප්‍රදේශයේ පහුගිය කාලේ මොරටුව මහ නගර සභාව මැදිහත්වෙලා අපි විසින් ඉදිකරපු කාණු පද්ධතිවල අභ්‍යන්තර ජලය ගලා එන ආකාරයෙන් ඉදිකර කාණු පද්ධතිවල උඩ වැසුම් මාර්ග ගණනාවක මේ අවස්ථාව වෙනකොට සොරුන් ගලවාගෙන ගොස් තියෙනවා. අපි පහුගිය දවස්වල විශේෂයෙන් ෆැන්සිස් මන්ත්‍රීතුමා අපි යකඩ බඩු කඩවල පවා හොයාගෙන ගියා, පොලිස් පැමිණිලි දාලා තියෙනවා. අපේ පොලිස්බල ප්‍රදේශවල පොලිස් ස්ථාන වල මේ වෙනකම් අපිට හොයාගන්න බැරිවෙලා තියෙනවා. ගරු නගරාධිපතිතුමනි, නමුත් මිනිස්සුන්ට උත්තරයක් විධියට අපිට මේක දෙන්න බෑ. එක හොයනවා හොයනවා කියලා වහාම පිළියම් යෙදිය යුතුයි. මම ඔබතුමාට පෞද්ගලිකවත් කථාකරා ඔබතුමා විසඳුමක් ලබා දෙන බව මතක් කරා. මම ඉතා වුවමනාවෙන් මේ සභාවෙන් ඉල්ලනවා. එයට උත්තරය කඩිනමින් ලබාදෙන්න. විශාල අනතුරු වෙමින් පවතිනවා ඒ ප්‍රදේශයේ වලවල්වල වැටිමෙන් මිනිස්සු විශාල වශයෙන් අනතුරුවලට ලක්වෙමින් සිටින නිසා වහාම ඒ සඳහා ක්‍රියාත්මක වෙලා එම කටයුත්ත නිමකර දෙන්න කියලා ඉතාමත් ඕනැකමින් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**03(5)** <u>මහ නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ප්‍රදිප් ශ්‍රියන්ත මන්ත්‍රීතුමා කිව්වා වගේම මොරටුවේ මත්ද්‍රව්‍ය එහෙම වැටලීම් කරද්දි මොරටුවැල්ල උතුර මගේ කොට්ඨාශයේ සැඟෙන ගණිකාවන් ප්‍රමාණයක් ඉන්නවා. ගරු නගරාධිපතිතුමනි, එනිසා නගර සභාවට යාබද නිවෙසියන් ඉඩම් විකුණමින් ගමෙන් යන තත්වයට පත්වෙලා තියෙනවා. ඒක නිසා ගරු නගරාධිපතිතුමනි, පොලිසියත් එක්කහරි එකතුවෙලා මේ ගණිකාවන් තුරන් කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු නගරාධිපතිතුමනි, මොරටුව ප්‍රධාන බස් නැවතුම්පොල තවමත් පැරණි තත්වයේමයි පවතින්නේ, අපි ප්‍රකාශ කරා අපේ ආණ්ඩුවත් එක්ක මෙය නවිකරණය කරනවා කියලා එනිසා ඒක නවිකරණය කර දෙන්න කියලා ගරු ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

**03(6)** <u>මහ නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ආයවනා පෙත්සම් පැමිණිලි යටතේ කරුණු කිහිපයක් කෙටියෙන් ඉදිරිපත් කරන්න අවසර ඉල්ලනවා. මුලින්ම අලුත් අවුරුද්දේ 2022 අභියෝග රැසක් තියෙන අවුරුද්දේ ගැටලු ගණනාවකට මේ රටේ ජනතාවත් මොරටුවේ ජනතාවත් මුහුණදෙන මොහොතක ගරු නගරාධිපතිතුමනි කොරෝනා උවදුර යම් ප්‍රමාණයකට පාලනය වෙමින් එද්දි ඩෙංගු උවදුර නැවත හිස ඔසවමින් තියෙනවා. මගේ පැමිණි ල මේවන විට මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය තුල අවධානම් කලාප කිහිපයක් නම් වෙලා තියෙනවා විශේෂයෙන් ලුනාව, ලක්ෂපතිය මධ්‍යම, සොයිසාපුර, කටුබැද්ද වැනි ප්‍රදේශවල ඩෙංගු රෝගින් එකවර වාර්තාගතවිමේ ප්‍රවනතාවක් පෙනෙමින් තියෙනවා. ගැටලුව තියෙන්නේ ගරු

නගරාධිපතිතුමනි, සභාවක් ලෙස අපිට පැවරි තිබෙන වගකිම අපි නිසිලෙස ඉටු කරනවාද සහ එ වගකිමේ කොටසක් වෙච්ච ජනතාවගේ පැත්තේ වගකිමත් නිසිලෙස ඉටු වෙනවාද කියන ප්‍රශ්ණය අපිට තියෙනවා. විශේෂයෙන් කසල ප්‍රශ්ණය තවමත් ගරු නගරාධිපතිතුමනි, තැන් ගණනාවක පාරවල්වල මේ කුණු කසල ගොඩගැසිමේ අවස්ථා ඔන තරම් අපිට දකින්න තියෙනවා. එක ඇතුලේ මදුරු කිටයන් බෝවිම තව දුරටත් වැඩිවෙලා තියෙනවා. කාණු පිරිසිදු කිරිම යම් ප්‍රමාණයකට සිදු වුනත් එය තවමත් නිසි ආකාරයෙන් සිද්ධවෙන්නැ කියන විවේචනය අපිට තියෙනවා. අපිට ඉන්නවා ඩෙංගු කණ්ඩායමක් හැබැයි මේ කිසිදු ආකාරයේ කටයුත්තකට එ අය නිසි පරිදි දායක වෙනවාද කියන ප්‍රශ්ණය අපිට තියෙනවා. විශේෂයෙන් මදුරු තෙල් ඉසිම අදවෙනකොට සම්පුර්ණයෙන් නැවතිලා.එවගේම තමයි දුමාණය කිරිමේ කටයුතු මේවන විට සිද්ධවෙන් නෑ. එකට අපිට සිද්ධ වෙනවා MOH කාර්යාලත් එක්ක කථා කරලා විශේෂයෙන් සොයිසාපුර පහුගිය දින කිහිපය තුල ඩෙංගු රෝගින් එකවර පස් හය දෙනෙක් වාර්තා විමත් එක්කMOH කාර්යාලයට කථා කරලා තමයි අවසානයේ අපිට ගෙන්න ගන්න සිද්ධ වුනේ දුමායනය සිද්ධ කරන්න. අපිට තියෙන විවේචනය මෙහෙමයි අපි කවුරුත් මේ සභාවේ නියෝජිතයො ලෙස අපිට තියෙන වගකිම නිසියාකාරව ඉටුකරන්නැ කියන චෝදනාව පාලක පක්ෂය වෙත ඉදිරිපත් කරනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා, ඔබතුමා කථාකරන කොට තොරතුරු දැනගෙන කථා කරන්න. ඔබතුමන්ලා ඕකමයි කරේ. ඔබතුමා දන්නවාද මේවන විට රටේ බෙහෙත් නෑ බෙහෙත් ගන්නත් නෑ. මුදලට ගන්නත් නැහැ. බොහොම අමාරුවෙන් බෙහෙත් ටිකක් ගෙනල්ලා ගහනවා. අපිට MOH කාර්යාල වලින් තමයි දිගටම දුම්මානය කරන තෙල්ටික දුන්නේ. මේ වනවිට එක සම්පුර්ණයෙන්ම ප්‍රති ෂේප කරලා මේ වන විට රටේ තෙල් නෑ. තෙල් ටිකක් ගෙනාවා එ ටික අපිට දොස්තරවරුන්මයි කිව්වේ රුස්විම් වලට ඇවිල්ලා සම්පුරණයෙන්ම තෙල් ඉසින එක නවත්වන්න.එක කරන්න එපා. දුම්මානය තියෙන තැන්වලට විතරක් ගහන්න අපිට තොරතුරු දුන්නේ නෑ. රුස්විම් වලට එන්නේ නෑ. මේවා මුකුත් නොදැන තමන් ඉන්න සභාව හැල්ලුවට ලක් කරමින් මාධ්‍යට කථාකරන එක දැන්වත් නවත්වන්න. මේවා තොරතුරු හොයන්න. දන්නැතිව කියවන්න එපා.

<u>මහ නගර සභා මන්ත්‍රි - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමා, ඔබතුමා අපිට කියන්නේ, MOH කාර්යාල ජෙ. වි. පි. යේද? මේ ඔබතුමාලාගේ පාලනයනේ ඔබතුමාලා දැනගන්න ඔනේ මේවා හරියට පාලනය කරගන්න.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා, ඕන තරම් කියව ගන්න කියවනවාට වඩා හැරෙන්න ප්‍රතිඵලයක් නෑ. තමන් ඉන්න සභාව, මෙකෙන් කියක් හරි අරගෙන එළියට යන සභාව, සභාවේ අඩුපාඩුකම් කථාකරනවා. අඩුපාඩුකම් කොහෙන්ද එන්නේ කියලා බලන්නේ නැතිව. අපිට මේ සල්ලි දීලා ගන්න පුලුවන් දෙයක් නෙමෙයි. මේවා දෙන්නේ විධිමත් විධියට ක්‍රමවත් විධියට MOH කාර්යාලයෙන්.

<u>මහ නගර සභා මන්ත්‍රි - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමා, MOH කාර්යාල දෙන්නැත්තම් ඔබතුමන්ලාට විකල්ප වැඩසටහනක් නැද්ද?සෞඛ්‍ය අමාත්‍යංශයට කථාකරන්න බැරිද? මං කියන්නේ දැන් MOH කාර්යාල දෙන්නැ කියලා අපි නිකන් ඉන්න ඕන. මේ කඹ ඇදිල්ල මෙහෙම කරන්න එපා. කඹ ඇදිල්ලෙන් තව

දුරටත් ජනතාව අසරණ වෙන්නේ එක නිසා කරුණාකරලා ඔබතුමාලාගේ මේ කටයුත්ත වගකිම ඔබතුමාලා ඉෂ්ඨ කරගන්න. අපි නෙමෙයි MOH එක පාලනය කරන්නේ. පාලනය ඔබෙයි. ඔබයි පාලකයා. අපි ඇවිල්ලා අඩුපාඩු පෙන්වලා දෙනවා.ඔබතුමන්ලා දැනගන්න ඔන එවට අදාල කටයුතු සිදුකරන්න. එ නිසා ඩෙංගු උවදුර දිනෙන් දින වැඩිවෙනවා මොරටුවෙත්.රටෙත් එහෙමයි. එ නිසා කරුණාකරලා මෙවට උත්තර සපයන්න කියලා ඉල්ලිම කරනවා ඊළගට සොයිසාපුර ක්‍රිඩාපිටිය පහුගිය අවුරුද්දකට එකාමාරකට කලින් මම ගිය සභාවෙත් කථාකරා අර පැති විකේට්ටු තුනක් සවිකරා. ඉදිකිරිම් ඇතුලේ එක තාම සම්පූර්ණ වෙලා නෑ. එක නිසා දැන් අපි ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රතිපාදන වලින් ශරිර සුවතා මධ්‍යස්ථානය යම් ප්‍රතිසංස්කරන කටයුත්තක් අපි කරා. එක දැන් නුදුරේදි අවසන් වෙනවා. එ ස්ථානය භාවිතා කරන අයගෙන් ඉල්ලිමක් තියෙනවා අර පැතිවිකේට්ටුවේ සෙල්ලම් කරන තරුණ පිරිසක් ඉන්නවා.නිකන් ඇවිල්ලා ක්‍රිකට් ගහනවා. දැන් එ අය එක කරන කොට බෝල අර දැල කැඩිලා දැල අස්සෙන් එනවා.මම අවස්ථා කිහිපයකදිම ඉංජිනේරු අංශයට මේක කිව්වා. අදාල TO මහත්වරුන්ට කිව්වා. හැබැයි අද වෙනකම් කිසිදු ක්‍රියා මාර්ගයක් අරගෙන නෑ. ඒ නිසා කරුණාකරලා අපි මේ නැත නැවත ඉල්ලන්නෙ අපිට විවෙචන කරන්න පුලුවන් ගරු නගරාධිපතිතුමණි විවෙචනයට වඩා අපිට උත්තර ඔනේ.මොකද අපිත් වගකියන්න ඔන ඔබත් වගකියන්න ඔන කවුරුත් මහජන නියෝජිතයෝ.මේකේ පක්ෂ විපක්ෂ භේදයක් නෑ නගර සභාවේ මහජන නියෝජිතයන්ට. එනිසා අපි කාටත් මේකේ වගකිම තියෙනවා.එනිසා කරුණාකරලා ඔබතුමා මැදිහත්වෙලා අඩුමතරමේ අපිකරපු ව්‍යාපෘතිය වඩාත් ඵලදායි සාර්ථක ව්‍යාපෘතියක් බවට පත්කරගන්න එ ස්ථානයේ අදාල කටයුතු නිමකරලා දෙන්න ඒ ඉල්ලීම කරනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමන්ලා ව්‍යාපෘතියක් කරේ නෑ. අඩුපාඩු වලට ව්‍යාපෘතිය එකතු වුනා විතරයි. එළිමහන් ජිම් එකේ ඔබතුමන්ලා කරපු ව්‍යාපෘතියක් නෙමෙයි ව්‍යාපෘතියේ අඩුපාඩු වලට එකතු වුනා විතරයි. ඔබතුමා කිව්වේ ඔබතුමාගේ ව්‍යාපෘතියක් කියලා.

(සභා ඝෝෂා)

<u>මහ නගර සභා මන්ත්‍රි - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමා, තව ඉල්ලිමක් තියෙනවා විදුලි අධිකාරිතුමාගෙන් එ ස්ථානයේ සොලා පවර් විදුලි පද්ධතිය නැවත අක්‍රියවෙලා තියෙනවා ලයිට් 02 යි පත්තුවෙන්නේ.එ දෙකත් යථා තත්වයට පත්කරලා සම්පුර්ණකලා දෙන්න කියන ඉල්ලිමත් මේ අවස්ථාවේ කරනවා.

03(7) <u>මහ නගර සභා මන්ත්‍රි - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ආයාවනා හා පෙත්සම් අයිතමය යටතේ කරුණු කිහිපයකත් ඉදිරිපත් කරන්න තිබෙනවා. ලැබුවා වූ නව වසර 2022 වර්ෂය සියලු දෙනාටම සුභ වේවායි කියා ප්‍රාර්ථනා කරනවා. එවගේම ගරු නගරාධිපතිතුමනි, 2022 අලුත් වසරක් මොරටුව නගර සභාවේ අපි පාලනය කරන ජනතාවාදි ආයතනයක් විදියට මොරටුවේ 2022 වර්ෂය සඳහා විපක්ෂ නාගරික මන්ත්‍රිවරයෙක් විදියට මේ අවුරුද්දේ අපි ගිය අවුරුද්දට වඩා මේ අවුරුද්ද අපි සාර්ථක කරගන්නට තිබෙන වසරක් ගරු නගරාධිපතිතුමණි. අපි ගත්තොත් මොරටුව නගර සභාවේ විදුලි අංශයේ සේවය කරන අපි ජනතාවත් එක්ක නිතරම ගැටෙන අංශයක් විදියට වැඩි සේවයක් කරන අංශයක් විදියට මේ විදුලි අංශයේ ත්‍රිරෝද රථ දෙකක් තියෙනවා. මේ ත්‍රිරෝද රථ දෙක නොකඩවා වැඩ කරන් යන එම සේවකයෝ කඳු පල්ලම් අස්සමුල්ලවල් වලට යන

රථ දෙකක් තමයි විදුලි අංශයේ ත්‍රිරෝද රථ දෙක මම දන්නා විදියට මේ ත්‍රිරෝද රථ දෙක වසර ගණනාවක් වෙනවා එම අංශයට ලබා දිලා. මේ මෑත කාලේදි මොකක් හරි සේවයක් කරන්න යන කොට බ්‍රේක් නැතිව පුවක්අරඹ හරියේදි මම දන්න විදියට සමහර විට ජීවිත හානි වෙන්න තිබ්බා එ සේවකයන්ගේ. මම කියන්නේ නිතරම ජනතාවාදි විදුලි අංශයක් විදියට ජනතාවත් එක්ක නිතරම ගැටෙන අංශයක් විදියට එ අංශයට ලබා කඩිනමින් අලුත් ත්‍රිරෝද දෙකක් ලබා දෙන්න හෝ නැත්නම් එක යථා තත්වයට සේවාව කරන්න පුලුවන් තත්වයකට අලුත් වැඩියා කරදෙන මෙන් මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා. සුරේෂ් මන්ත්‍රිතුමා කිව්වා වගේ මේ අවුරුද්දේ කොවිඩ් වසංගත රෝගය මේ සතියක් ඇතුලත ඉතා විශාල ලෙස වර්ධනය විමක් වෙනවා. මොකද අපේ උත්සව කාලේ හමාර වෙලා මේ වෙනකොට රෝගීන් ඊයේ වෙනකොට රෝගීන් හයසිය ගානක් විහිදිලා තව සති කිහිපයක් ඇතුලත මේක දිනෙන් දින වර්ධනය වෙන්න පුලුවන්. අපි මොරටුව නගර සභාවක් විදියට අපි සෞඛ්‍ය අංශත් එක්ක කථා කරලා එ නිළධාරිත් එක්ක කථා කරලා අපේ එ රෝගී තත්වය අවම කරන්න ජීවිත හානිය නැතිකරන්න වැඩ පිළිවෙලක් අපි මේ අවුරුද්දේදි ගිය අවුරුද්දේ වගේ සකස් කරමු කියන එක මම මේ අවස්ථාවේදි අවධාරණය කරන්න ඕන. එ වගේම තමයි ඩෙංගු වසංගත රෝගය ගිය සතිය වෙනකොට මම අද ලංකාදිප පත්තරේ දැක්කා. සතියක් ඇතුලත රෝගීන් විශාල ගානක් වර්ධනය වෙලා තියෙනවා මුලු සමස්ථ ලංකාවේම. එවගේම මොරටුවේත් දවසෙන් දවස සතියෙන් සතිය මොරටුව ප්‍රදේශය තුලත් වර්ධනය විමත් සිදුවෙනවා ඩෙංගු රෝගීන්. එම නිසා අපි මේ වසර තුල එ රෝගීන් අවම කරන්න වැඩසටහනක් හදමු.අපි ගිය වසර වලට වැඩිය මේ වසරේ එක මරණයක් වත් සිදුවෙන්නැති විදියට අපි මේ වසරතුල වගබලාගමු කියන එක මම තමුන්නාන්සේට ප්‍රකාශ කරන්න ඕන. එවගේම ගරු නගරාධිපතිතුමා, මොරටුවේ පාරවල් කිහිපයක් තියෙනවා ගිය වසරේත් සංවර්ධනය කරන්න බැරිවෙච්ච පාරවල් මම හිතන විදියට පිම්ක්ස් ගෙනාපු නැති මාස කිහිපයක් තිබ්බා.එ පිම්ක්ස් තමා සකස් කරන්න පුලුවන්. කල්දේමුල්ල ප්‍රදේශයෙත් තියෙනවා විශාල ලෙස එය ඉක්මණින් කඩිනමින් යන්න බැරි තත්වයක් වෙලා තියෙනවා. කල්දේමුල්ලේ සි පී ද සිල්වා මාවත ඉතා අබලන් වෙලා තියෙනවා. සුදර්මාරාම පාරත් එහෙමයි හැම පාරම එක ඉතා ඉක්මණින් එ පාරවල් ටික සංවර්ධනය කරලා දෙන්න කියලා මම ඔබ තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා. එවගේම ගරු නගරාධිපතිතුමනි, මම කියන්න ඕන මේ අවස්ථාවේදි අලුත් අවුරුද්දේදි අපේ හිටපු විපක්ෂ නායකතුමා ඉතා විශාල සේවයක් කරා මොරටුවේ ගාවින් මත්තේස් මැතිතුමා. රාවතාවත්ත සුසාන භූමියේ එතුමාගේ පිළිරුවක් සවිකරලා තියෙනවා. එක දැක්කාම අපිට සතුටුයි. එවගේම එතුමා සේවය කරපු මොරටුව වගේම රාවතාවත්ත ප්‍රදේශයට විශාල සේවයක් කරා. පක්ෂ භේදයකින් තොරව. මම මේ සභාවට කියන්න කැමතියි හැකිනම් එතුමාගේ නම සදහන් වන පාරක් සදහන් කරන්න පුලුවන්නම් එතුමා වෙනුවෙන් මොකද අමිල සේවයක් කරපු මන්ත්‍රිවරයෙක් හා විපක්ෂ නායකවරයෙක්. රාවතාවත්ත බල ප්‍රදේශය තුල එතුමා වෙනුවෙන් එ නම ස්ථාපනය කරන්න පුලුවන්නම් ගාවින් මත්තේස් මන්ත්‍රිතුමාගේ නම ස්ථාපනය කරන්න පුලුවන්නම් ඉතා වටිනවා කියන එක මේ අවස්ථාවේදි සදහන් කරන්න ඕන. එවගේම ගරු නගරාධිපතිතුමණි, අපි මේ වසර අපේ මන්ත්‍රිවරුන්ටත් ඔබතුමාටත් නිළධාරින්ටත් සමස්ථ මොරටුවේ සිතු පැතුම් සියල්ල ඉෂ්ඨවෙන වසරක් වේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඩ වෙනවා.

**03(8) <u>මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, විශේෂයෙන් ආයතන හා පෙත්සම් යටතේ අවධාරණය කලයුතු කරුණු කිහිපයක් තියෙනවා.එකක් තමයි ගිය මාසේ මහා සභාවට පස්සේ විශේෂයෙන් පිස්සු බල්ලෙක් මොරටුවේ මිනිසුන් විශාල පිරිසක් තරු පෙන්න හපලා තිබ්බා.එ නිසා ගරු නගරාධිපතිතුමණි එ අනුව අපි ස්තුතිවන්ත වෙන්න ඕනැ මොරටුව මහා නගර සභාවේ පශුවෛද්‍ය අංශය ගිහිල්ලා බල්ලාව අල්ලාගෙන මැරුණට පස්සේ ඔලුව යවලා තිබුණා වෛද්‍ය පරික්ෂණ ආයතනයට. පශු වෛද්‍යතුමියටත් කාර්යය මණ්ඩලයටත් අපි ස්තුතිවන්ත වෙනවා යුහුසුලුව එ කටයුත්ත කිරිම සම්බන්ධව එ නිසා ගරු නගරාධිපතිතුමනි සමහරක් වෙලාවට අපි දන්න දන්න අයට ඉන්ජෙක්ෂන් ගහගන්න කිව්වා. විශේෂයෙන් මම හිතන්නේ එහෙම නොගහාපු පිරිසකුත් සමහරක් වෙලාවට ඉන්න පුලුවන්. එනිසා ගරු නගරාධිපතිතුමනි, විථී සුනඛයන් නිසා මේ ප්‍රශ්ණය තව දුරටත් උග්‍රවෙන්න පුලුවන් එනිසා මම හිතන්නෙ මොරටුව මහා නගරසභාව යම් සාධනිය මට්ටමක ඉදලා එන්නත් කරනය කරනවා. එ නිසා නැවතත් අයිතිකරුවන් නැති විථී සුණඛයන් සදහා එන්නත් කිරිම ආරම්භ කරලා තියෙනවා.එක කඩිනම් කරන්න කියලා ඉල්ලිමක් කරන අතර ඊලග ප්‍රශ්ණය තමයි මේ සුණඛයාගේ ඔලුව යැව්වාට පස්සේ අපේ ජාතික වෛද්‍ය පරික්ෂණ මධ්‍යස්ථානයට එකේ ශිතකරණය කැඩිලා එනිසා ටික දවසක් ගියා මම හිතන්නේ එකේ රිපෝට් එක ගන්න එනිසා මම හිතන්නේ ජාතික වෛද්‍ය පරික්ෂණ මධ්‍යස්ථානය ශිතකරණය කැඩිලා තියෙනවානම් එකට අවශ්‍යකරන කටයුතු කරන්න. අනෙක් එක ගරු නගරාධිපතිතුමනි, විශේෂයෙන් මම හිතන්නේ කවුරු කොහොම කිව්වාත් මොරටුව මහා නගර සභාවේ අපේ කසල කළමණාකරන වැඩ සටහන හොදින් තියෙනවා. පහුගිය කාලේ මම දැක්කා කවුද කියන්න මම දන්නේ නැ. පක්ෂයක කාන්තා සංවිධානයක් වෙන්න ඇති ගිහිල්ලා මේ කසල කළමණාකරනය වෙන් වෙන් වශයෙන් වෙන් කරනවා. මේක කරදරයක් කියලා කිව්වා. අද වෙනකොට මම හිතන්නේ කොරෝනා වලින් හෙම්බත් වෙච්ච මිනිස්සු අලුත් ඩෙංගු විකෘතියත් එක්ක තවදුරටත් අවධානමක ඉන්නේ.එ නිසා මම හිතන්නේ එකට කසල කළමණාකරනය කියන එක වැදගත් එනිසා අපි යුහුසුලු වෙන්න ඔන විශේෂයෙන් මමත් අපේ වාහනය එන්න පරක්කුවුනොත් ෂොටවුට් කරපු ටික භාරදෙනවා. එක නිසා එක අපේ යුතුකමක්.එ නිසා මම හිතන්නේ අපි කුමන පක්ෂයක් වුනත් අපි මෙය වෙන් වෙන් වශයෙන් වෙන් කිරිමේ ආදර්ශය ප්‍රයෝගිකව අපි දෙන්න ඔන වගේම කොයිවෙලාවකවත් ජනතාවට අපි එක වෙන්කරන්න එපා කියන පනිවිඩය දුන්නොත් මම හිතන්නේ මේක උග්‍ර වෙනවා. එනිසා මම හිතන්නේ කසල කළමණාකරන සහයෝගයෙන් කරන්න ඔන.කොරෝනා වලින් බැටකාපු ජනතාව විකෘති ඩෙංගුවලින් බැට කන එක නවත්වන්න. අපේ දායකත්වයත්,නගරසභාවේ දායකත්වයත් දෙන්න ඔන විශේෂයෙන් අප ආණ්ඩුවේ යම් යම් කාරණා තිබ්බත් MOH එක හෙල උරුමයටවත් UNP එකටවත් කාටවත් අයිති එකක් නෙමෙයි එක රජයේ කාර්යයක් එක නිසා එකේ තියෙන අඩුපාඩු අපේ අඩුපාඩුත් සකස්කරගෙන ඩෙංගුවලටත් කොරෝනා වලින් හෙම්බත්වෙච්ච මිනිස්සුන්ට ඩෙංගුවලින් බැටකන්නැතිවෙන විධියට වැඩ කරමු. අපි කසල කළමණාකරණයට දායකත්වය ලබාදිය යුතුයි කියන විශ්වාසය තුල ඉන්නවා.

ගරු නගරාධිපතිතුමනි, මම ගිය සභාවේ 2021/12/08 දාතමයෙන් යුතුව මම ඔබතුමාට ලිපියක් ඉදිරිපත් කලා. එතුමයි අපේ මාර්ගවල නාමපුවරු සකස් කිරිම සම්බන්ධයෙන් එනිසා ඔබතුමා එකට අනුකුලතාවය දිලා එකට අනුමැතිය මම ඉදිරිපත් කරා. එවගේම මුහුණු වාර්තාවක් දිලා තිබ්බා එක මම දිපු වාර්තාවක් නෙමෙයි එ පිළිබදව කුකුසක් තිබුණත් නැතත් අදටත් අවසරය දෙන්න කියලා ඉල්ලා සිටිනවා. එවගේම ඊළග කාරණය තමයි ගරු නගරාධිපතිතුමනි,

කටුබැද්ද පොල විවෘත කරද්දි මම හිතන්නේ එකේදි එ ජනතාවටම ලැබිය යුතු මිනිස්සුන්ට එක ලැබ්මේදිත් අපි මුලික වශයෙන් ඉදිරිපත් කරා මුලික ගෙවිමක් කරන්නේ නැතිව ලබාදෙන පොරෝන්දුව තමයි තිබුණේ එහෙම ගෙවිමක් කරන්නැතිව ලැබිය යුතු මිනිස්සුන්ට ලබාදෙයි කියන විශ්වාසය අප තුල තියෙනවා

නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා

ගරු මන්ත්‍රිවරුනි, විශේෂයෙන්ම මම සජිත් දුමින්ද පිරිස් ගරු මන්ත්‍රිතුමන්ට ස්තුතිවන්ත වෙනවා. එකක් තමයි ලෙඩෙක් සමහර කෙනෙක් දකින විදියට ඔබතුමා දකින්නේ නැ. සමහර කෙනෙක් නොදකින දේ ඔබතුමා දකිනවා. සමහර කෙනෙක් දකිනදේ ඔබතුමා නොදකිනවා. ඉස්පිරිතාලේට ලෙඩෙක් බැස්සුවාම හොදවුනොත් අනේ දෙයියන්ගේ පිහිටයි. මැරුනොත් දොස්තරගේ සරණයි. එවගේ එක්කෙනෙක් සභාවෙන් කෙරෙන්න ඔන දෙයක් කියලා කෙරෙන්න එන නැති දෙයකට සභාවට දෝෂාරෝපණය කරනවා. සමහරු පිස්සු කියන බල්ලාගේ තත්වයත් එක්ක වෛද්‍යවරයාට ස්තුතිවන්ත වෙනවා. මේක තමයි තත්වය. බැරිවෙලාවත් මෙතුමියටත් හොයාගන්න බැරිවෙලා ඕකට උපක්‍රමයක් යෙදුවේ නැත්නම් ඔබතුමාගේ යටතේ ඉන්නේ දොස්තර ඔබතුමා මෙක බලන්න ඕනැ ඔබතුමාට පිස්සුද කියලා මගේන් අහන්නත් පුලුවන්.මේක තමයි ඇත්ත. අපි විපක්ෂයේ ඉන්න කොට ඕවා කරේ නැ. මට තියෙන ප්‍රශ්ණය මෙකයි ඔක නෙමෙයි අපි කලේ අපි කලේ ඔයිට එහා එකක්. අපි හැම තිස්සේම කියන්නේ එක අපි කලේ ඔයිට එහා එකක්. දැන් නිකන් හරි බැරිවෙලාවත් බල්ලා කාලා කට්ටියට පිස්සු හැදිලා දොස්තර නෝනාටත් මේක බලාගන්න බැරිවුනානම් කියන්නේ නගරාධිපතිතුමා යටතේ තමයි දොස්තර ඉන්නේ එකේ වගකිම නගරාධිපතිතුමාට. මම කැමතියි මට ස්තුතිය නැතිවුනත් එතුමියට ස්තුතිවන්ත වුනාට මොකද එතුමිය වැඩක්කරන්න කාර්යයශුරයි.එතුමිය වැඩ කරනවා. එතුමිය පිළිබද ප්‍රශ්ණයක් නැ. මේක තමයි වෙන්නට ඕනැ කලයුතු දේ කරන්න ඕනැ වෙන් වෙලා නෙමෙයි එකතුවෙලා. එකතුවෙලා කිරිමේදි මම හිතනවා අපිට පරිනත වෙච්ච විපක්ෂ නායකවරයෙක් ඉන්නවා. එතුමාගේත් ලොකු දැනුමක් තියෙනවා මේ සම්බන්ධව මම හිතන්නේ එකතුවෙලා ඔනේ අපි වැඩකරන්න. ඔබතුමාට බොහොම ස්තුතියි. ගරු මන්ත්‍රීතුමා, කටුබැද්දේ ඔබතුමා දන්නවා ඇති ස්ථානය වෙන්කරලා තිබුණාට ස්ථානයක් හදලා තිබුණාට වෙළෙන්දො යන්නැතිව දවස් තුනෙන් මම වෙළෙන්දන්ව අයිනකරලා දුන්නා. ඔබතුමා දන්නවා. අපි උදව් කරනවා කියන්නේ ඔක නැත්තම් අපිට තිබුනේ ඔක හැදුවට දෙන්නේ නැ කියන්න. මම මේක නොදි හිටියේ නැ. මෙතන එකත් මම නොදි හිටියේ නැ.එහෙම කුහකකමක් අපිට නැ. අපි දන්නවා කවුරු කලත් මේ රජයේ දේවල් කරනකොට කුහකත්වයකින් බලන්න බැ. මම එහෙම කරලා නැ. කරන්න මට වුවමනාවකුත් නැ. හෙට ඔබතුමන්ලාගේ කවුරුහරි පාර්ලිමේන්තු මන්ත්‍රිවරයෙක් මොකක්හරි කරාම කරන්න පුලුවන්නම් එක අපි කරනවා.එක අපේ වගකිම පූජ්‍ය ඕමල්පේ සොභිත ස්වාමින් වහන්සේ කථා කරලා කියපු අපිට කරදර කරපු වස බල්ලෙක් ඉන්නවා ඔබතුමියට මම හිතන්නේ බොරුපන පැත්තේන් ගෙනාපු බල්ලෙක් වෙන්න ඔන අද පූජ්‍ය ඔමල්පේ සෝභිත හාමුදුරුවෝ ලියුමකින්ම එවලා දිවුලපිටියට ප්‍රවාහනය කරන්න අපි උන්වහන්සේට කිව්වා. අපි එ කටයුතුවලට දායක වෙනවා. මම හිතන්නේ එතුමිය බොහෝම සත්භාවයෙන් එ කටයුත්තට දායක වෙලා තියෙනවා. මෙන්න මේක තමයි වෙන්න ඕනැ. සභාවේ නගරාධිපතිවරයාට ස්තුති නැතිවුනාට සභාවේ ගෞරවනිය නිලධාරින් කරන්නාවු සේවාවට ස්තුති කිරිම මම හිතන්නේ ප්‍රායෝගිකයි. එවගේම සභාවට යම් යම් නිළධාරින් යම් යම් පිටස්තර අයගෙන් සභාවත් එක්ක එකතුවෙලා වැඩ කරන්න ඕනැ අවස්ථාවලදි එ සදහා ඔවුන්ව යොමු කිරිම කරනනේ නැතිව සභාවට පෙරලා දෝෂාරෝපණය කරන එක මම හිතන්නේ ඔබ කරන්නේ නැ ඔබට ස්තුතියි.

**03(9)** <u>මහ නගර සභා මන්ත්‍රී - ආර්.එම්.ඒ.දෝන දිලාශිනී මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනී, මීට කලිනුත් මේ කථාව කරලා තියෙනවා. සොයිසාපුර කොට්ඨාශය පිළිබඳව සවස රාජකාරිය නිමවෙලා එන ජනතාවට පාරේ ඉදිරියෙදි නිවසට එමටවත් නොහැකි තත්වයක් මතුවෙලා පිටස්තර වෙළෙඳුන්ගේ තොතැන්නක් බවට සොයිසාපුර පත්වෙලා තියෙනවා. අනතුරු වැඩියි. මමත් දෙපාරක් අනතුරුවලට භාජනයවුනා.පදිකයින්ට ගමන් කිරිමට ස්ථානයක් නෑ එ ඉදිරිපස. නමුත් ප්‍රජා ශාලාව ඉදිරිපිට සිට නවෝද්‍යා එකට යනකම් වම් පස තිරුව හොඳට ඉඩ පහසුකම් තිබ්බා. ජනතාව ගමන්කරා වාහනයක් පාර්ක් කරලා ගිහිල්ලා ෂොපින් කරලා එන්න අවස්ථාව තිබුණා. නමුත් දැන් ලොතරැයි එකම නියෝජිතයෙක් තවත් ලොතරැයි කුඩුවක් ස්ථාපිත කරලා තියෙනවා. ගෙනල්ලා එතන මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් මේ අසල ගැවසෙනවා. ඇහුවාම කියන්නේ අර නියෝජිතයාගේ අරයාගේ මෙයාගේ එහෙම තමයි කියන්නේ කිසිම අවසරයක් නගර සභාවෙන්වත් කිසිම තැනකවත් නෑ. කකුල් එනවා වගේ එකපාරට ගෙනල්ලා දාගන්නවා. පදිකයින්ට ගමන් කිරිමටවත් තත්වයක් නැති තත්වයක් තමයි නගරාධිපතිතුමණී සොයිසාපුර ඇතිවෙලා තියෙන්නේ. මේ ව්‍යාපාරිකයෝ ඉන්න ඕනැ වෙළදාම් කරන්න ඕනැ නමුත් පළවෙනි තැන ජනතාවට නිදහසේ අනතුරුවලින් තොරව මාර්ගයේ ගමන් කිරිමට හැකියාවක් තිබ්මයි. විකුණන වෙළදුන්ටත් අනතුරකට අතවනනවා. කුඩා දරුවන් සමග රෙද්දක් එළාගන්නවා. ගෙනල්ලා මොනවාහරි බඩු ටිකක් දාගන්නවා අර එන වාහන වලට පෙන්නේ නෑ අර බිම ඉදගෙන ඉන්න පොඩි දරුවන්වත් කාවවත්. අනතුරුවලට අතවැනිමක් තමයි එ වෙළදුන්ටත් සිද්ධවෙන්නේ. එබැවින් පාර උඩ හවසට කිසිසේත් ඇතුල් කරගන්න නොහැකි තත්වයක් තියෙනවා. නමුත් අඩක සිට කොනට යනකම්ම සුද්ධ පවිත්‍ර වෙලා තිබ්ච්ච ඉඩ තිබ්ච්ච එ භූමියෙත් ලොතරැයි කුඩු ගෙනල්ලා ස්ථාපිත කරගන්නවා එකම නියෝජිතයාගේ නමුත් කිසිම අවසරයක් කිසිම තැනක ලබාගෙන නෑ නගරාධිපතිතුමණී. එබැවින් එ පිළිබදව පොඩ්ඩක් සොයා බලා ජනතාවට නිදහසේ ගමන් කිරිමට ෂොපින් කිරිමට එ අවස්ථාව ලබා දෙන්න මම කිහිප අවස්ථාවක් පැමිණිලිකරා කොමසාරිස්තුමාට, ගණකාධිකාරිතුමාට හාසයයට වගේ තමයි එගෝල්ලෝ පොඩ්ඩක් බැලුවේ. එහෙම නෙමෙයි. මෙක බරපතල ප්‍රශ්ණයක්, අනතුරක් වෙලා ජීවිත හානියක් වුනොත් වුනාට පස්සේ මේ වෙළෙන්දුන්ටත් අනතුරක් සිද්ධ වෙන්න පුලුවන් ගමන්කරන පදිකයින්ටත් අනතුරක් වෙන්න පුලුවන්. මොකද බඩු පාරට දමාගෙන තමයි මේගෝල්ලෝ වෙළදාම් කරන්නේ. එනවුන්ස් කරගෙන ගියා නගර සභාවෙන් නමුත් එකට කිසිම අවනතවිමක් පෙන්නන්ම නෑ නගරාධිපතිතුමනි. එ සම්බන්ධව සොයාබලා කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(10)** <u>මහ නගර සභා මන්ත්‍රී - රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා</u>

ගරු නගරාධිපතිතුමණී, මට ලැබිලා තියෙනවා ලිපියක් මොරටුව මෝල්පේ 551/ඒ ග්‍රාමයේ 90/8 දරණ ඉඩමේ ඉදිකරමින් පවතින මහල් 04 ක ගොඩනැගිල්ලක් සම්බන්ධව ප්‍රශ්ණයක් මම එ ලිපිය ඔබතුමාට ඉදිරිපත් කරනවා.

ගරු නගරාධිපතිතුමනි, එවගේම එගොඩඋයන 2705/14බි සංදකාන්තිය නව ගාලු පාරේ පි.එම්.පිරිස් මහතා මෝදර ජයගත්පුර නිවාස සංකිර්ණයේ ඇති පාරක් සම්බන්ධව ප්‍රශ්ණයකුත් යොමුකරලා තියෙනවා. මම එයත් ඔබතුමාගේ අවධානය සදහා යොමුකරනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි විශේෂයෙන්ම ලබන මාසයෙ සිට අද දිනයෙදි කරන ලද සියලුම ආයාචනා පෙත්සම් පැමිණිලිවල පිළිතුරු එ අදාල වෙන්නාවූ මන්ත්‍රීවරුන්ටත් එවගේම සභාවටත් යොමුකරනවා ලබන මාසේ සිට එ කටයුත්ත නියමිත පරිදි සිදුකරනවා.එවගේම දිලාශිණි රාජකරුණා මන්ත්‍රීතුමිය කථාකරපු කාරණය පිළිබදව ගණකාධිකාරි ආදායම්ගෙනුත්, නාගරික ඉංජිනේරුත්, ආදායම් පරීක්ෂක අංශයත් සියලුදෙනාගේ එකමුතුවෙන් මහජන සෞඛ්‍ය පරික්ෂකතුමාගෙත් එකමුතුවෙන් සැදුම්ලත් කමිටුවක් අද සභාව අවසානයේදි හැකිවුනොත් යන්නත් එසේ නැත්නම් සඳුදා දිනයේදි ගිහිල්ලා මට වාර්තාවක් ලබා දෙන්න.

**03(11)** <u>මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ආයචනා පෙත්සම් පැමිණිලි යටතේ කොරලවැල්ල සමාජවාදි නිවහන් පෙදෙසේ දෙල්ගහ අසලින් ඇති මාර්ගය මේවෙනකොට මාර්ගය කඩා වැටීමට ආසන්න තත්වයක තියෙනවා නගරාධිපතිතුමණි. එ නිසා ප්‍රදේශවාසින්ගේ ඉල්ලිමක් තියෙනවා ඉතා ඉක්මණින් එක හදලා දෙන්න.නැත්නම් එක කාණුව කඩාගෙන වැටුනොත් සුලු මුදලින් වැඩේ නිමකරගන්න පුලුවන් කාර්යය තව වැස්සකටවත් අහුවුනොත් එක ටිකක් බරපතල වෙනවා.මොකද වාහන කිහිපයක් මාර්ගයෙන් ගමන් කරනවා. එනිසා ජනතාවගේ ඉල්ලීමක් ඉටු කර දෙන මෙන් ඉල්ලා සිටිනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි ෆැන්සිස් මන්ත්‍රීතුමා යෝජනාව දාලා තියෙන්නේ හෙට අනිද්දා සිද්ධවෙනවා.

**03(12)** <u>මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජේ ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමණි සිංහල සිනමාවට කල සේවය වෙනුවෙන් විශේෂයෙන්ම අපේ මාධ්‍යවේදි හේන්රි ප්‍රියශාන්ත මහත්මයාට වටිනා සම්මානයක් ලැබිලා තියෙනවා. එතුමා 1950 වර්ෂයේ සිට සිංහල සිනමාව වෙනුවෙන් එ කරන ලද ඇගයිම වෙනුවෙන් එ නිසා මොරටුවේ පුවත්පත් වාර්තාකරුවෙක් හැටියට එතුමා සැම මසකම සභාවට ඇවිදින් සභාවේ වාර්තාවන් මොරටුව ජනතාවටත් සමස්ථ ශ්‍රී ලාංකිකයන්ටත් මුදිත මාධ්‍යය තුලින් එළිදක්වනවා. මේ මොහොතේදි මොරටුව ජනතාව වෙනුවෙන් එතුමාට එ කල සේවයට ලැබිච්ච සම්මානය වෙනුවෙන් මොරටුව ජනතාවගේ සුභාසිංශන අපි පිරිනමනවා.

**3(13)** <u>මහ නගර සභා මන්ත්‍රී - එම්. චන්ද්‍ර ගාමිණි පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමණි පාරිසරික ප්‍රශ්ණ දෙකක් සරලව විසදිය හැකි ප්‍රශ්ණ දෙකක් ඉදිරිපත් කරන්න බලාපොරෝත්තුවෙන්නේ එකක් ඉදිරිපත් කරනවා. මොරටුව පුවක් අරබ පුවක් අරබ පාර අංක 31 නිවසේ පදිංචි ලක්සිරි ප්‍රනාන්දු මහතා එක ඔහු පෞද්ගලිකව ඉදිරිපත් කලත් ප්‍රදේශයටම තර්ජනයක් වෙච්ච ප්‍රශ්ණයක් එ පුවක්ගහ තොටුපල පාර ආරම්භවන ස්ථානය හැම මොහොතකම මැරිච්ච සතෙක්ගේ වගේ කුණු ගදක් නිකුත් කරනවා.එතන ත්‍රිරෝද රථගාල

තියෙන්නේත් බස්නැවතුම්පෙල තියෙන්නෙත් එම ස්ථානයේමයි. හොයලා බලද්දි ගරු නගරාධිපතිතුමණි ආසන්න හෝටලයකින් අපද්‍රව්‍ය හා අපජලය එනවා.එක වතාවක් නෙමෙයි දවස පුරාම දුර්ගන්ධය තියෙනවා.කරුණාකර එකට පියවරක් ගන්න කියලා ඉල්ලනවා.

ගරු නගරාධිපතිතුමනි, මොරටුව මොරටුමුල්ල පුවක්ගහ තොටුපල පාර අංක 12 නිවසේ පදිංචි ප්‍රසන්න රුද්‍රිගෝ මහත්මයා ඔහු ඉල්ලන්නේ කාණුවක් පිළිබඳ ගැටලුවක්.පුවත්ගහ තොටුපල පාර පැතිකාණුව දිගටම තියෙනවා. ගරු නගරාධිපතිතුමණි අඩි 50 පමණ ප්‍රමාණයක් විතර සම්පූර්ණයෙන් වැහිලා.එනිසා දෙපැත්තෙන්ම එන වතුර පාර හරහා ගමන් කරනවා.එක නිසා එය පැතිකාණුව ප්‍රතිසංස්කරණය කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

**03(14)** <u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මෑතකදි ගල්කිස්ස ඇතිවූ සිද්ධිය සම්බන්ධව කිඹුලෙක් නිසා සැහෙන්න ආන්දොලාත්මක තත්වයක් ඇතිවෙලා තියෙනවා. කටුබැද්ද ඇවිදින මන්තිරුවට දැන් මිනිසුන්ගේ පැමිණීම ගොඩක් අඩුවෙලා තියෙනවා. මොකද එ කිඹුලා මිනිස්සුන්ට පෙනමානෙක දර්ශණය වෙනවා. උදේ පාන්දර ඇවිදින්න එන මිනිස්සු දැන් එම සම්පූර්ණයෙන් නතරකරලා තියෙනවා. එම නිසා මෙක වන ජිවි දෙපාර්තමේන්තුවට හරි යම් කිසි ස්ථානයකට කියලා එ කිඹුලා එම මන්ත්‍රිරුවට එන එක වළක්වන්න අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**03(15)** <u>මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, ඉදිබැද්ද සුභ ජන මාවතේ ඩබ්ලිව් නිතා මෙන්දිස් මහත්මිය අත්සන් 10 ක් එක්ක මට ලිපියක් ඉදිරිපත් කරලා තියෙනවා. පාරේ පොඩි කොටසක් ඉතිරිවෙලා තියෙනවා එය සදා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**03(16)** <u>නියෝජ්‍ය නගරාධිපති - ඩී.සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ලිඛිත ලියුමක් මට පැමිණි මේ සම්බන්ධව දැනුවත් කරනවා. අපි තමුන්නාන්සේලා හැමෝම දන්නවා මොරටුව මහ නගර සභාවේ රැකියා ලබා දිමේදි විවිධ චෝදනා ඇවිල්ලා තියෙනවා.එම නිසාම මටත් පුද්ගලිකව ඇවිල්ලා තියෙනවා රැකියා සභාවේ විකුණනවා. මේ පිළිබඳව කිසිදු පියවරක් ගන්නැ ඔය වගේ ජනතා චෝදනා රැසක් අපිට ලැබිලා තියෙනවා.එවගේම මේ මන්ත්‍රිවරුන්ටත් ලැබිලා තියෙනවා. මහජන නියෝජිතයෙක් වශයෙන් මෙක අපකිර්තියක්. නිළධාරින්ටත් මෙක සිදුවෙන්න පුලුවන් නිළධාරින් රැකියා විකුණනවාද කියලා දන්නේත් නෑ. මම මෙක අපි තමුන්නාන්සේ හරි මම හරි නැත්තම් මේ මන්ත්‍රි කෙනෙක් හරි සභාවට ඉදිරිපත් කරානම් කවුරුත් මෙක පිළිගන්නේනෑ. මෙවැනි දෙයක් අපි කියන දේ පිළිගන්නේ නෑ. එනිසා මම ලිඛිතව ඉල්ලීමක් කරා බස්නාහිර පළාත් කොමසාරිස්තුමාට එතුමා දැනුවත් කරලා තියෙනවා. මම මේ ටික කියවන්නම් නියෝජ්‍ය නගරාධිපති සමන්ත සිල්වා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද මොරටුව මහ නගර සභාව විසින් රැකියා ලබා දිමේදි නිසි ක්‍රමවේදයකින් තොරව රුපියල් ලක්ෂ ගණන් ලබා ගනිමින් රැකියා ලබා දෙන බවට පැමිණිල්ලක් සදහන් කරනු ප්‍රායෝගිකව තහවුරු කරගැනිමට නොහැකි බව නිර්දේශ වෙනවා. මේකෙන් සදහන් වෙනවා එ නිළධාරින් මේ පිළිබඳ සොයලා බලලා රැකියා ලබා දිමේදි ඔවුන්ට මුදල් ලබා ගත්තේ නැහැ කියන එක සදහන් කරලා තියෙනවා. එහෙමනම් අපි සභාවක්

වශයෙන් මම හිතනවා අපි හැමදෙනාම නිවැරදි වුනා කියලා. අපි තමුන්නාන්සේලා කවුරුත් හදවතට එකගව දන්නවා කවුරු හරි ගන්නවානම් අපිට එක මට එක සදහන් කරන්න බෑ. පුද්ගලිකව කාටත් චෝදනා කරන්නත් බෑ. සභාවක් වශයෙන් මන්ත්‍රීවරුන්ට අද සතුටුවෙන්න පුලුවන් අවස්ථාවක් සියලුම දෙනාට එ කරන ලද තොරතුරු ලබා ගැනීමේදී සදහන් කරලා තියෙනවා එවැනි තොරතුරක් ඔවුන්ට දැන ගැනීමට හැකියාවක් නැහැ කියලා. එතුලින් අපි සභාවක් වශයෙන් සතුටුවෙන්න ඔන කියලා මම විශ්වාස කරනවා. එනිසා මම හිතනවා කවුරු හරි මට ස්තුතියක් හරි කරයි කියලා අපි තමුන්නාන්සේලා මේ චෝදනාවෙන් නිදහස්වීම සම්බන්ධයෙන් ප්‍රශංසාවක් හරි වෙයි කියලා විශ්වාස කරනවා. කමක් නෑ කෙසේ වෙතත් මම නියෝජ්‍ය නගරාධිපති වශයෙන් මේ නිළධාරින්වත් මන්ත්‍රීවරුන්වත් මේ චෝදනාවෙන් ගලවාගත්තා කියලා මම විශ්වාස කරනවා. ඊළග කරුණ තමයි ගරු නගරාධිපතිතුමනි, මම පෞද්ගලිකව විශ්වාස කරනවා කවදාවත් මේ රටේ අපි හැමදෙනාම විශ්වාස කරනවා මේ රටේ තියෙන ණය බර අපිට ගලවා ගන්න හැකියාවක් නැහැ කියලා. රජයක් වශයෙන් අපිටත් ඊළගට පත්වෙන රජයටත් නැත්නම් පැවති රජයන් වලටවත් මේ රටේ තියෙන ණය මුදල ගෙවන්න හැකියාවක් නෑ. එනිසා කවදාවත් මේ රට ගොඩ එන්නේ නෑ කියන විශ්වාසය අපිට තියෙනවා. මොකද ණය බරිත රටක් වශයෙන් තමයි අපිව දකින්නේ. අපිට හැමදාම ජීවත්වෙලා ඉන්න වෙලා තියෙන්නේ මේ ණය බරිත රටක ඉතින් ඇත්ත වශයෙන්ම ණයක් තියෙනවානම් පවුලක් වශයෙන් ගත්තොත් එ පවුලට වුනත් කවදාවත් ගොඩ එමක් නෑ. අපේ රටට ගොඩ එමක් නෑ කියන එක මම විශ්වාස කරනවා. එවගේම ජනවාරි 03 වෙනිදා සභාවක් වශයෙන් රාජකාරි ආරම්භ කරපු වෙලාවේ අපේ මොරටුවේ ප්‍රධාන පියතුමා ජුඩ්රාජ් පියතුමා සදහන් කරා ඇමරිකාවේ එක උත්සව අවස්ථාවකදි ලයිට් ගියාම හැම කෙනාම එ ලයිට් ගිය එකට දොස් කිව්වා මිසක් කිසිකෙනෙක් එකට විසදුමක් බැලුවේ නෑ. නමුත් එක තරුණයෙක් තමන්ගේ දුරකථනයේ ටොච් එක ඔන් කරා ඔන් කරාම එ එළිය දිහා හැමෝම බලලා මේ හැම දෙනාම ටෝච් ඔන් කරාම එ අදුර දුරු වුනා කියන එක උන්වහන්සේ සදහන් කරා. අන්න එ වගේ අපිත් මගෙත් අදහසක් අනුව මම මේවෙලාවේ සදහන් කරනවා මේක සමහරුන් ලොකුවට හිතන එකක් නෑ. සමහරවිට කවදාවත් කරන්න බැරි වැඩක් වශයෙන් සදහන් කරන්න පුලුවන්. නමුත් මම විශ්වාස කරනවා අපි ජාතියක් වශයෙන් අපි මේ රටේ පුරවැසියන් වශයෙන් අපිට මේ රටවෙනුවෙන් අපේ දුවා දරුවන් වෙනුවෙන් අනාගත දරුවන් වෙනුවෙන් යමක් කරන්න පුලුවන්නම් එක තමයි අපි කරන්න ඔන කියන එක නැත්නම් කවදාවත් රජයකට රට පාලනය කරන කිසිම පාලකයෙක් මේ රට ණය අරගෙන එ පැවැත්ම කරගෙන ගියා ඇර මේ ණය ගෙවලා ඉවර කරන්න ඔන පදනමක් සමහර පාලකයන්ට තිබුණත් කරන්න බැරි තත්වයටම අපි දුප්පත් රටක් බවට පත්වෙලා තියෙනවා. එන්න එන්නම මේ ණය බර වැඩිවෙනවා. ඉතින් මගේ සංකල්පයක් වශයෙන් මම සදහන් කරනවා මම යෝජනා කරනවා මම අද දින මට මේ සභාවෙන් ලැබෙන මාසික දීමනාව එක මගේ පුද්ගලික ධනය බවට පත්වෙනවා. මම එ මාසික දීමනාව බැංකු ගිණුමක් ආරම්භ කරලා අපේ රටේ ඉන්න ජනතාව මම හිතන්නේ දෙකෝටි තිස්පන්ලක්ෂයක් ඉන්නවා. කෝටියක් අයින් කරත් අවුරුදු දහඅටට වඩා අඩු අය කෝටි එකාමාරකට වැඩි පිරිසක් ඉන්නවා මේ රටේ යම් දෙයක් හම්බකරන අය මේ අය මාසිකව හෝ තමන්ට පුලුවන් අවස්ථාවක මේ ගිණුමට දාලා අපිට පුලුවන් ප්‍රමාණයෙන් මේරට වැසියන් වශයෙන් මේ ණය මුදල ගෙවන්න අපේ අනාගත දරුපරපුර ණය බරින් නිදහස් කරන්න අපි හැමදෙනාම එකමුතුවෙලා මේ ගිණුම සාර්ථක කරන්න අවශ්‍ය කටයුතු කරමු කියන ඉල්ලීම කරනවා. එවගේම අද දින ගිණුමක් අපි ආරම්භ කරනවා. විශේෂයෙන්ම බැංකු නිළධාරින්ගෙන් උපදෙස් අරගෙන ගිණුමක් ආරම්භ කරන්නේ කොහොමද කියන එක එ අනුව නිත්‍යානුකුල විධියට රටේ මහා භාණ්ඩාගාරයට මුදල් යන විධියට මම ගිණුමක් ආරම්භ කරලා මගේ මාසික දීමනාවෙන් ආරම්භ කරනවා කියලා සදහන් කරනවා. එනිසා මම ඉල්ලීමක් කරනවා අපි මේ ආදර්ශය මොරටුවෙන් පටන් අරගෙන මුලු රටටම ලබා දෙමුයි කියන එක. එ අනුව අපි හැමදෙනාම එකමුතු වුනොත් මේක කරන්න පුලුවන් මේක සාර්ථක කරගන්න පුලුවන් කියන එක විශ්වාස කරනවා. මම අර ඉස්සේල්ලා කිව්වා වගේ විවිධ දෙවල් එන්න පුලුවන් මේ පිළිබදව විවේචනයට ලක්කරන්න පුලුවන් දැනුත් සිද්ධවෙන්න පුලුවන් හෙටත් සිද්ධවෙන්න

පුලුවන් මේ මොහොතෙත් සිද්ධවෙන්න පුලුවන් යමක් කරන කොට එකට චෝදනා එනවා එ ගැන හිතන්න එපා තමන්ගේ අරමුණ කරන්න කියන එක අපි අහලා තියෙනවා එනිසා මම මේ අවස්ථාවේ සභාවේ සදහන් කරනවා මගේ මාසික දීමනාව අද දින මේ රටේ ණය ගෙවන්න මේ අපේ අනාගත දරුවන් ණය බරින් නිදහස් කරන්නට අදහස් කරගෙන අපි හැමදෙනාම එකට සහයෝගය ලබාදෙන්න කියන ඉල්ලීමත් මා ඔබතුමා හා මේ සභාවෙන් සියලුම නිළධාරින්ගෙන් ඉල්ලීමක් කරනවා.

**03(17)** <u>මහ නගර සභා මන්ත්‍රී - එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමණි, පසුගිය සභාවේදි සභාවවෙත ඉදිරිපත් කරා ගරු ජනාධිපතිතුමා වෙත යොමුකරන ලද පෙත්සමක් සම්බන්ධව. එකේදි මම කරුණු ඉදිරිපත් කරා. ගරු නගරාධිපතිතුමණි මම දැනගන්න කැමතියි මම එදා විශේෂයෙන්ම මතක් කරා ගරු නගරාධිපතිතුමාටත් ගරු කොමසාරිස්තුමාටත් එ සම්බන්ධව මොකද්ද එ සම්බන්ධව වුනේ කියන වාර්තාවක් ඉදිරිපත් කරන්න කියලා මොකවත් නෙමෙයි මට ඇත්තට හිතුනා අපේ උප නගරාධිපතිතුමන් කථාකරද්දි මොකද සමහරු මේ සම්බන්ධව විවිධ මත ප්‍රකාශ කරන හින්දා. අපිව නිවැරදි කරන්න දොලවත්ත මන්ත්‍රිතුමා මේ සම්බන්ධව පරික්ෂණයක් ඉල්ලුවාද දන්නේත් නැහැනේ.මේක සම්බන්ධව සභාවට නිවැරදිතාවය ඉදිරිපත් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**03(18)** <u>මහ නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමණි, කරුණු දෙකක් තියෙනවා කථාකරන්න පළවෙනි කරුණ තමයි නගරාධිපතිතුමණි මොරටුව ප්‍රදේශයේ අපි දැක්කා දෙසැම්බර් මාසේ මේ මහා විදිය ගත්තාම මහා විදිය වාහන තදබදයක් තියෙනවා.අපි මේ සභාවේ අවස්ථා ගණනාවකදි කථාකරලා තියෙනවා. සංවර්ධන කමිටුවේදි කථාකරලා තියෙනවා. එකට විසදුමක් හැටියට මෙතන රථගාලක් හදලා තියෙනවා.එක විවෘත වෙන්නේත් නැහැ. එ සම්බන්ධයෙන් අපි කථා කරලා තියෙනවා.අපි කථාකරාට ගරු නගරාධිපතිතුමණි මොරටුව නගරයේ ජනතාව දිනෙන් දින අපහසුතාවයට පත්වෙනවානම් මම හිතනවා අපි සභාවක් හැටියට සභිකයන් හැටියට චෝදනා කරන්නැතිව හැමවේලේම මේකට මොකක් හරි විසදුමක් තියෙන්න ඕන.මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමතියි මොරටුව ප්‍රදේශයේ ජන ගණත්වය බොහෝම වැඩිවෙලා. අපිට පාරක යන්න බැහැ.ඉස්සර පැයට කිලෝමීටර 40 වේගයෙන් ගියානම් දැන් එක 10, 5 වෙලා මේක ජනතාවගේ කාලය මේවලට අපි නගර සභාවක් හැටියට නාගරික මන්ත්‍රිවරුන් හැටියට පරිපාලන නිළධාරින් හැටියට එවලට විසදුම් හොයන්නැත්නම් මාසයක් පුරා කථා කරලා අපි නිකම් දීමනා ලබාගෙන ගිහිල්ලා තේරුමක් නැහැ.අපි හැමෝටම වගකීමක් තියෙනවා.ඉතින් අපි පක්ෂ පාට භේදයකින් තොරව ප්‍රශ්ණවලට අපි සාධනියව එකතුවෙලා අඩුම ගානේ මේ අලුත් අවුරුද්දේවත් මේවට විසදුම් හොයමු කියලා ඔබතුමන්ගෙන් ඉල්ලීමක් කරන්න කැමතියි.ජනතාවගේ ප්‍රශ්ණවලට විසදුම් හොයන්න දේශපාලනයක් අවශ්‍ය නැහැ.මම හැමදාම මේක කියනවා.ඔබතුමා හොද දෙයක් කරනවානම් අපි ඔබතුමාට සහයෝගය දෙන්නම් මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමතියි පොලිසියත් එක්ක එකතුවෙලා අපි එකපාරක් කථා කරා මේ පාර වන්වේ කරන්න එක අසාර්ථක වුනානම් මොකක්ද ඊට පස්සේ තියෙන විකල්පය.ඔබතුමා මේ රථගාල විවෘත කරන්නැත්නම් මොකක්ද ඔබතුමාට මේ වාහන ගමනාගමනයට තියෙන විකල්පය මොකක්ද මම ඉල්ලීමක් කරන්න කැමතියි එහෙනම් අපි

පොලිසිය ගෙනල්ලා මාසය ඇතුලත කමිටුවක් පත්කරලා මේවලට විසඳුමක් හොයමු.දෙපැත්තේ වාහන පාර්ක් කරන්න බැහැ.වැටක් ගහන්න ඔන මිනිස්සුන්ට හැමතැනින්ම පාර පනින්න බැරිවෙන විධියට මම ඉල්ලීමක් කරන්න කැමතියි.

ගරු නගරාධිපති තුමනි, ලංකාව ගත්තාම විශාල ආර්ථික අර්බුදයක සිටින්නේ.මේක අපි අවිවාදයෙන් තොරව පිළිගතයුතු දෙයක්.ඉතින් අපි නගරසභාවක් හැටියට අපේ පරිපාලනය ගැන ගත්තාම මේ පරිපාලනයෙත් අපි දකිනවා අක්‍රමිකතා තියෙනවා සිද්ධ වියයුතු දේවල් තියෙනවා සිද්ධ නොවියයුතු දේවල් තියෙනවා.අපි පිළිගන්න දෙයක් තමයි රටක් කවදාවත් දියුණුවෙන්නේ නැ වංචාවල් දූෂණ තියෙන කොට විධිමත්ව පරිපාලනයක් සිදුවෙන්නැති අවස්ථාවක අපි මේ ඉන්ජපිෂන් වෙනුවෙන් ගොඩක් මුදල් වියදම් කරනවා.අපි කැමතියි මේ 2022 වර්ෂයේදි අපි මේතන ඇවිල්ලා සභාවේ කථාකරනවා මේ වාර්තා තියෙනවා මේවා ඡායාපිටපත් කරලා අපිට එවනවා.මෙවල දින ගණන් දාලා තියෙනවා.කමිටුවල රැස්වෙනවා මේ සියලු දෙවල්ම වියදම්.මේ අපේ කාලය එවා වියදම් ඡායාපිටපත් කොල වියදම්. මීටින් වලට එන අපිට වියදම් කන්න දෙන එවාට වියදම් එවට විසඳුම් දෙන්නැත්නම් එක ජනතාවට සියලු දෙනාටම කරන මහා ලොකු අපරාධයක්.මම ඉල්ලිමක් කරන්න කැමතියි මේක ඇතුලේ වංචා දූෂණ අක්‍රමිකතා තියෙනවානම් අපි පොඩ්ඩක් මෙතනින් එහාට ගිහිල්ලා ටිකක් ඔබ්බට ගිහිල්ලා සාධනියව මේ දෙවල් දිහා බලමු.අපි බලලා සැබැ ලෙස ප්‍රශ්ණවලට විසඳුම් හොයමු.මේ මාතෘ සායන තියෙනවා.දොරවල් කැඩිලානම් ජනේල් කැඩිලානම් ප්‍රජා ශාලා තියෙනවා එවා නඩත්තුවෙන්නේ නැත්නම් මේවා දාලා අපි කමිටුවලට ඉදිරිපත් කරලා හැමෝටම චෝදනා කරලා තේරුමක් නැහැ නගරාධිපතිතුමණී මම ඉල්ලිමක් කරන්න කැමතියි මුදල් කමිටු වාර්තාවේ තියෙනවා ඩිජිටලයි ෂෙෂන් ගැන යෝජනා ඉදිරිපත් කරලා තියෙනවා.සමාජ මාධ්‍යජාලා පටන්ගන්න යුටියුබ් පටන්ගන්න ඉන්ස්ට්‍රගෘම් පටන්ගන්න මේකේ බේසික් ටෙක්නොලොජිවත් නැහැ. මේ වාර්තාවල තියෙන එවා වෙනවාද කියලා මොනිටර් කරන්න දැන් මෙතන ඇවිල්ලා මන්ත්‍රිවරු දෙවල් ඉදිරිපත් කරනවා.එ දේවල් සිද්ධ වුනාද බේසික් දෙවල් අද තාක්ෂණයත් එක්ක ඉදිරියට යන්න ඔන.මම නගරාධිපතිතුමණී මම ඔබතුමාගෙන් ඉල්ලිමක් කරනවා මෙතන අපි පොඩ්ඩක් බුද්ධිමත් ජනතාවක් විධියට වැඩ කරමු බුද්ධිමත් ජනතාවක් සභිකයෝ විධියට වැඩ කරමු. අපි මේ ප්‍රශ්ණ වලට අඩුම ගානේ 2022 වර්ෂයේදිවත් මේවලට නිකන් කථාකරලා ගෙදර ගිහිල්ලා තේරුමක් නැතිව මේ දේවල්වලට මේ පරිපාලනය විධිමත් කරන්න මොනාද කරන්න පුලුවන් කියලා අඩුම ගානේ නගර සභාව 2022 පරිපාලනය විධිමත් කරන්න මොනාද කරන්න පුලුවන් සාධනිය පොයින්ට් විසිපහක් දාලා එවා ක්‍රියාත්මක කරමු කියලා මම ඔබතුමාගෙන් ඉල්ලිමක් කරන්න කැමතියි.තුන්වෙනි කරුණ ඩෙංගු සම්බන්ධයෙන් ඉස්සේල්ලා මන්ත්‍රිවරුත් කථා කරා චෝදනා කරා නමුත් ඩෙංගු ප්‍රමාණය වැඩිවෙලා තියෙනවා.එවාවලටත් චෝදනා නොකර පාරවල් සුද්ධ කරනවාට ෂෙඩියුල් තියෙනවා.එවා ක්‍රියාත්මක වෙනවාද ක්‍රියාත්මක නොවෙනවානම් මොකක්ද තියෙන විකල්පය එ මිනිස්සුන්ව අඩගහලා ඔබතුමාට මම කියන ප්‍රශ්ණවලට විසඳුම් ඇති මහා පොළවෙ කියන දේවල් යථාර්ථයක් හැටියට පෙන්නේ නැත්නම් තේරුමක් නැහැ.මම ඔබතුමාගෙන් ඉල්ලිමක් කරන්න කැමතියි අඩුම ගානේ 2022 වර්ෂයේවත් මීට වැඩිය හොදට අපි වැඩ කරමු කියලා ඉල්ලා සිටිනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, විශේෂයෙන්ම නියෝජ්‍ය නගරාධිපතිතුමා කථා කරපු එ කාරණය සම්බන්ධයෙන් මගේ අතේ එ කොලේ නැති නිසා මම දන්නේ නැහැ මොකක්ද එකේ තත්වය. චුට්ටක් මට දුන්නානම් මේක මොකක්ද වෙලා තියෙන්නේ කියලා කාටද ඇවිල්ලා තියෙන්නේ කියලාවත් මම දන්නේ නැහැ. විශේෂයෙන්ම මම හිතන්නේ එතුමාගේ සත්භාවය පිළිබඳව අපි අගය කොට ඔන. විශේෂයෙන්ම මම හිතනවා මේවැනි පරික්ෂණයක් කිරිම සඳහා මට මේකේ පෙන්නේ නාගරික කොමසාරිස් මොරටුව මහා නගර සභාවට පළාත් පාළන දෙපාර්තමේන්තුව බස්නාහිර පළාත ගාමිණි පින්තු පළාත් පාලන සහකාර කොමසාරිස් වැඩ බලන පළාත් පාළන කොමසාරිස් වෙනුවට නියෝජය නගරාධිපති සමන්ත සිල්වාට පිටපත.මම හිතන්නේ මේකේ තියෙන්නේ මොරටුව මහා නගරසභාවට රැකියා ලබා දිමේ ඇතිවෙන දූෂණය මගහරවා ගැනිම සඳහා කියලා තමයි. හෙඩ්ලයින් එක තියෙන්නේ.ඉතින් එකේ විශේෂයෙන්ම උක්ත කරුණ සම්බන්ධව නියෝජය නගරාධිපතිතුමා විසින් මා වෙත ඉදිරිපත් කරන ලද 2020.08.25 දිනැති ලිපිය හා බැදේ.එකි ලිපියේ සඳහන් ගැටලු පිළිබඳව පරික්ෂණ බලා නිරික්ෂණ බලා නිර්දේශ සහිතව වාර්තාවක් ලබා දෙන ලෙස කොළඹ දිස්තික් පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත කරන ලද දැනුම් දිමට අදාලව කොළඹ දිස්ත්‍රික් සහකාර කොමසාරිස්ගේ සි එල් ජි කියලා අංකයක් තියෙනවා.2021.08 දිනැති වාර්තාවේ නිරික්ෂණ මා වෙත වාර්තාව ඇත.නියෝජ්‍ය නගරාධිපති සමන්ත සිල්වා මහතා විසින් ඉදිරිපත් කරන ලද මොරටුව මහා නගර සභාව විසින් රැකියා ලබා දිමේදි නිසි ක්‍රමවේදයකින් තොරව රුපියල් ලක්ෂ ගණන් ලබා ගණිමින් රැකියා ලබාදෙන බවට පැමිණිල්ලේ සඳහන් කරුණු ප්‍රායෝගිකව තහවුරු කර ගැනිමට කරුණු නොමැතිබව නිරික්ෂණයවි ඇත.එ අනුව ඔබ සභාවේ පත්විම් සඳහා බඳවා ගැනිම් සිදු කිරිමේදි පවත්තන ලද පරික්ෂණ මණ්ඩල සඳහා මෙම කාර්යාලයෙන් නියෝජනයක් ලබා ගැනිම සඳහා පත්විම් බලදාරියා විසින් ලිඛිත ඉල්ලිමක් සිදු කල යුතුබව දන්වමි.මේ ලිපිය සම්පුර්ණයෙන්ම කියෙවුවාම කාරණා දෙකක් මතුවෙනවා.එකක් නියොජය නගරාධිපතිතුමා විසින් මෙහෙම දෙයක් වෙනවා කියලා දිලා තියෙනවා.එතුමාට ලැබුණු ලිපියක් අනුව එතුමා දුන්නා කියන එක මේකේ සඳහන් වෙන්නේ නැහැ.එතුමා විසින් දාලා තියෙනවා මෙන්න මෙහෙම දෙයක් වෙනවා කියලා.මෙක දිගින් දිගටම ගියවර ඡන්දයෙදි එපිට වර ඡන්දයෙදි මේකේ තියෙන්නේ ඩි සමන්ත සිල්වා මැතිතුමා විසින් ඉදිරිපත් කරන මොරටුව මහා නගර සභාව විසින් රැකියා ලබා දිමේදි නිසි ක්‍රමවෙදයකින් තොරව රුපියල් ලක්ෂ ගණන් ලබා ගනිමින් රැකියා ලබාදෙන බවට පැමිණිල්ල කරලා තියෙනවා.එතුමාට ලැබුණු පැමිණිල්ලක් අනුව කරා කියලා නෙමෙයි තියෙන්නේ එතුමා කරා කියලා තියෙන්නේ.එකේ බරපතලම ප්‍රශ්ණය එක නෙමෙයි අපි දන්නවා ඔවා සාමානයයෙන් මැතිවරණවලදි එනවා 2011 මැතිවරණය 2018 මැතිවරණය පලවෙනි වතාවට ලංකාවේ මොරටුවාදි කියලා පක්ෂ 04 කින් ගෙනල්ලා මැතිවරණයේදි වුනා 2011 මැතිවරණයේදි වුනා, මහ මැතිවරණයේදි පවා වුනා. නගරාධිපතිත් රැකියා විකුණනවා මන්ත්‍රිවරුන්ට විකුණන්නත් දිලා බලාගෙන ඉන්නවා කියලා .ඉතින් එක සුද්ධවෙලා ඇවිල්ලා තියෙනවා.එක නෙමෙයි ප්‍රශ්ණය තියෙන්නේ මේවගේ දේවල් යොමුකිරිමේන් වෙලා තියෙන්නේ සභාවේ අයිතිය කප්පාදු කිරිමක් කරලා තියෙනවා පළාත් පාලන කොමසාරිස්.එ කප්පාදුව නියෝජ්‍ය නගරාධිපතිතුමා නගරාධිපතිවුනාමත් තමන්ට එන අයිතිය කප්පාදුවක් ඔය වෙලා තියෙන්නේ.එකෙදි කියනවා ආයතනික පත්විමේ පත්විම ලබාදෙන තනතුරුවලටත් එහෙන් කෙනෙක්ව ගෙන්න ගන්න මින් පස්සේ කියලා.මේක භයානකයි.අපි කවදාවත් මේවෙනකොට ගරු මන්ත්‍රිවරුන්ගේ දැනුවත්භාවය සඳහා මේ කියන්නේ මේවෙනකොට පළාත් සභාවක් විසින් ඇතිකරගන්නාවු ප්‍රඥප්තියක් තුල ඊයේ දිනයේදි සමහර විට අපේ නිශාන්ත ප්‍රදිනාන්දු ගරු මන්ත්‍රිතුමාවත් සමහරවිට මේ සම්බන්ධව නොදැනුවත්කම නිසා නැත්නම් එතුමා එ පිළිබඳව සොයන්නැති නිසා කථාකලාට එතුමා පිළිගත්තාට පස්සේ දන්නවා මොකක්හෝ සභාවට එකතුකරන්න නගරාධිපතිතුමා ගන්න උත්සාහයක් මේක.එතුමා සංවේදිවෙනවා අවශ්‍ය වෙද්දි එතුමා නැවෙනවා අවශ්‍ය වෙද්දි කෙලින් වෙනවා.එහෙම චරිතයක්.එ පිළිබඳව අපිට

තියෙනවා ගෞරවයක්.එකට වඩා මම හිතනවා එතුමා මේක කියන්නේ හෙටත් එතුමා කියයි මේක ඔය ලියලා එවුවාට තියෙනවා.නමුත් එක නෙමෙයි භයානක පැත්ත එතුමා කියනවා මේ අනුව ඔබ සභාවේ පත්වීම් සඳහා ගැනීමේදී පවත්වන ලද පරීක්ෂණ මණ්ඩලය සඳහා මෙම කාර්යාලයේ නියෝජනයක් ලබා ගැනීම සඳහා පත්වීම් බලධාරියාවන ඔබ විසින් ලිඛිත ඉල්ලීමක් කලයුතුබව කාරුණිකව දන්වමි.මේක හරි භයානකයි.අපිට අපේ ආයතනික පත්වීමට අපිට කාගෙන්වත් උපදේස් අවශ්‍ය නැහැ.

ගරු මන්ත්‍රීවරුනි, ආයතනික පත්වීම් වලට ඒ නිසා එක භයානකයි නිශාන්ත ප්‍රදිනාන්දු මන්ත්‍රිතුමා අපි උපලේඛන පරීක්ෂා කිරිමේදි අපිට වෙච්ච අවාසියක් එක්ක මේ වෙනකොට එන්තර වාසි යවලා තියෙනවා පළාත් සභාවට නඩුවක් අපි කියන්න පටන් ගන්නවා එකට ලක්ෂ 50 ක් 100 යක් යන්න පුලුවන් නමුත් එක ඔප්පුවෙන් එක ඔප්පුවක මුද්දර ආදායම 2019 ලියපු එකක් බලන්න ගියාම තියෙනවා ලක්ෂ එකසිය දහයයි තිස්නම දාහක එකක් එකේ රිසිට්පත අමුණලා නැතිනිසා අපිට ප්‍රති ෂෙපකරලා තියෙනවා සල්ලි දිම.ඒ ප්‍රඥප්තිය පනවාගෙන තියෙන්නේ මහ නගර සභා ආඥානගතේ පැහැදිලිවම තියෙනවා මුද්දර ආදායම් විතරක් නෙමෙයි බදු උකස් කර දෙන්නාවූ සියලුම දේවල මුද්දර ආදායම සභාව සතුයි කියලා.එහෙම තියෙද්දි එක උදුරා ගැනිමට පවත්වන ප්‍රඥප්තියේ කොන්දේසි විධියට දාලා තියෙනවා අංකය නිවැරදි වෙන්න ඔන බැංකුව නිවැරදි වෙන්න ඔන ඔප්පු අංකය නිවැරදිවෙන්න ඕනැ ඔප්පුව සඳහන් කරන්න ඔන මේවගේ ගොඩක් දේවල් සඳහන් කරලා අන්තිමට110 ගැන්විමේ කටයුත්ත කරනවා වගේම කෙනා කවුද කියනවාට වඩා සභාව අපි සභාවට වගකියන්න ඔන. අපි ඒ නිසා අපි මේවෙනකොට එන්තර වාසි යවලා ඉවරයි පළාත් සභාවට. අපි ඊලග සතියේ ජනාධිපති නිතිවේදියෙකුට දිලත් ඉවරයි.නඩුව කරනවා ප්‍රඥප්තිය අහෝසිකරාට පස්සේ මම හිතනවා අපිට ගියවර මාස තුනකදි අපිට ලැබුනේ නැති මුද්දර ආදායමක් අපි ගිහිල්ලා උදුරාගෙන හොයා ගත්තා ලක්ෂ හයසියය.එක ඔප්පුවකින් ලක්ෂ එකසිය දහයයි තිස්නම දාහක් තියෙනවා එක අහිමි කරන්න යනවා.ඊයේ පෙරේදා එක මහත්මයෙක් දිගින් දිගටම ආවා අදෝනා දෙමින් අවුරුදු 70 පැනපු කෙනෙක් එයා ලියලා අංක 04 වෙනුවට 12 බැංකුව මොරටුව වෙනුවට බොරලැස්ගමුව කියලා ලියලා.බොරලැස්ගමුවේ මහත්තයෙක් එගොල්ලන්ගේ අංකය 12 නිසා.එක අපි ඉල්ලුවාම දෙන්නේ නැ.මම මුද්දර ආදායම් එක්ක ලොකු පයිට් එකක් කරා.කරලා කරලා අන්තිමේට මුද්දර ආදායම් කිව්වා ඔව් මේක දෙන්න ඔන මොරටුව මහා නගර සභාවට ඔබ දැන් එටි එකේ ඇප්ලිකේෂන් එක භාර ගන්න භාර අරගෙන දැන් කරන්න ඔබ ගිහිල්ලා උපලේඛන චෙක්කරද්දි බෙරලැස්ගමුව උපලේඛනයෙන් එක අරගෙන අපිට දෙන්න අපි ඔකට සල්ලි දෙන්නම් කියලා.අපි හැම සතයක්ම සමහර වෙලාවට දොෂාරෝපන තියෙන්න පුලුවන් හැබැයි අනෙක් පැත්තෙන් කරන දේවල් පිළිබඳව මම හිතනවා නියෝජය නගරාධිපතිතුමා මෙවගේ දේවල් කරද්දි ඊට වඩා එහා දෙවල් හිතන්න ගොඩක් දේවල් තියෙනවා.මොකද මෙතන මම හැමදාම ඉන්නවෙන්නැ මැරිලා මෙතනින් යන්න පුලුවන් පැරදිලා යන්න පුලුවන් ඔබතුමා දිනලා මෙතනට එන්න පුලුවන් පාරාවලලු වෙනවා.මේවගේ දේවල් පාරාවලලුවෙනවා. තමන්ගේ පාලනයට පාරාවලලු වෙනවා. එනිසා මම හිතනවා මේවගේ දේවල් නුසුදුසු දේවල් සුදුසු දේවල් නෙමෙයි.එවා බෙරගන්න ක්‍රමවිධි තියෙනවා.මම හිතනවා මේක මොන විධියෙන්වත් එක්කෙනෙක් නෙමෙයි දෙන්නේක් නෙමෙයි පරීක්ෂණ මණ්ඩලයම නගර සභාවෙන් කරන්න බැ එහෙන් කරන්න කිව්වත් මම කරන්නේ නැ.එක එගොල්ලන්ට තියෙන අයිතියක් නෙමෙයි.එක අපේ අයිතියක් එවා අපි කරන දේවල් නෙමෙයි හැබැයි ඊට වඩා විධිමත් භාවය ලබාගන්න ඔන පරීක්ෂණය අපේ නිළධාරින් මගින් කරගන්නවා හැරෙන්න කාවත් අපි ගෙන්නන්නේ නැ.මේගොල්ලෝ මේ අත පිහදාගන්න ලිව්වට මෙහෙම කරන්න කියලා මේවා කරන්න පුලුවන් දෙවල් නෙමෙයි.අපි නිතියක් රිතියක් ක්‍රමවෙදයක් පනතක් එක්ක අපි දුවන්නේ.ඒ දුවපු නිසා තමයි වැටි වැටි නැගිට නැගිට අවුරුදු 16 ක් මේක කලෙත් එනිසා ඉදිරියේදිත් ඒ අනුව පනතට යටත්වෙලා පනතෙන් ගතයුතුදේවල් අරගෙන මම හිතෙනවා හෙට දිනයේ ගත්තාම කාලාවබෝධය නැතිවුනොත් මම හිතනවා දෙදහස් කියෙ ඉදලාද දන්නේ නැ අපිට එන මුදල ඒ මුදල කොහොමද කියලා

හිතාගන්නත්බෑ.එ මුදලට සාපේක්ෂව මොරටුව මහා නගර සභාවෙන් 2022 අවසාන වේද්දි මම හිතනවා අපිට පාරවල් බොක්කු කාණු ඉතිරි නොවෙන්න ලක්ෂ එක දාහකුත් නෙමෙයි දෙදහකුත් නෙමෙයි රෝසි සේනානායක මහත්මිය කියන විදියට එක මිලියන දෙක මිලියනුත් නෙමෙයි තුන මිලියන හතර මිලියන පහ මිලියන නෙමෙයි දහ මිලියනයත් වැඩිය සල්ලි වගයක් අපිට එයි සංවර්ධනය කරන්න. හැම සතයක්ම උදුරා ගන්නවා කියන පණිවිඩය තබමින් ආයාචනා හා පෙත්සම් පැමිණිලි සභාව හමුවේ තැබීම අවසානයි.

**04** **<u>ප්‍රශ්න :-</u>** නැත

**05** **<u>යෝජනා :-</u>** නැත

## 06 <u>2021 දෙසැම්බර් මස ස්ථාවර කමිටු වාර්තාවේ තීරණයන් සලකා බැලීම.</u>

06(01) 2021.12.06 දින පැවති ආයතන හා නිතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන් සලකා බැලිම.

2021.12.06 දින පැවති ආයතන හා නිතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම තිරණයන් එකමතිකව සභා සම්මත විය.

06(02) 2021.12.07 දින පැවති ඉඩම් හා නගර සංවර්ධන පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන් සලකා බැලිම.

**<u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අංක 2(1) කරුණ නිර්දේශය තියෙනවා ඉහත සංවර්ධන නිලධාරි ඉඩම් විසින් ඉදිරිපත් කර ඇති වාර්තාවට අනුව ඉදිරි කටයුතු ලිපි ගොනු මගින් සිදු කිරිමට තිරණය කරන ලදි. මේ අනුව කරුණ වාර්තාවෙන් ඉවත් කිරිමට කියලා එතකොට සම්පූර්ණ කරුණමද ඉවත් කරන්නේ.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුමා සම්පූර්ණ කරුණ නොවෙයි.

**<u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඊලඟ සභා වාර්තාවේදි හෝ දැනට අප සභාව ලෙස හඳුනා ගත්තු සියලු දේපල සහා ඉඩම් පිලිබඳ විස්තරයක් මේ වෙනවිට සභාව විසින් ජනතාවට පවරන ලද ඔප්පු පිලිබඳ සම්පූර්ණ විස්තරයක් අපට ලබා දෙන්න දැන් අවුරුදු 4 ක් අවසන් අපට දල අදහසක් ගන්න පුලුවන් දැනට මෙපමන ප්‍රමාණයක් අපි හදුනාගත්තා මෙපමණ ප්‍රමාණයක් අපි ජනතාවට දුන්නා කියන නිශ්චිත විස්තරය අපට ලබා දෙන්න කියන ඉල්ලිම කරනවා.

<u>නියෝජ්‍ය නගරාධිපති - ඩී.සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, කමිටු වාර්තාවේ 2(1) කරුණට අදාලව කමිටුවට ඇතුලත් කරන්න තව ස්ථාන බොහෝමයක් තියෙනවා. ඔප්පු ලබාදිය යුතු විශේෂයෙන්ම මොරටුවැල්ල ක්ලෝවිස් මාවත ප්‍රදේශය සභාව සතු ඉඩම් වල විශාල ප්‍රමාණයක් තියෙනවා. මම ඉල්ලීමක් කරනවා ඒ කොටසත් මේකට ඇතුලත් කරලා අවුරුදු 20-30-40 පදිංචි මිනිස්සු ඉන්නවා. ඒ අයටත් ලබදෙන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා ඉල්ලීම කරනවා. ඉඩම් කමිටුවට ඒ කරුණත් ඇතුලත් කරන්න කියන ඉල්ලීම කරනවා.

2021.12.07 දින පැවති ඉඩම් හා නගර සංවර්ධන පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම තිරණයන් එකමතිකව සභා සම්මත විය.

06(03) 2021.12.07 දින පැවති මහජන උපයෝගිතා ප්‍රජා සංවර්ධන ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන් සලකා බැලීම.

<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අයිතම 2(2) සහ 2(3) සම්බන්ධව පැහැදිලි කිරිමක් අවශ්‍යයි මෝදර ජයගත්පුර ප්‍රජාශාලාව සංවර්ධනය කර පසුව පාරම් පෙර පාසැල ස්ථාපනය කිරිම හෝ කාය වර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවිම කාරණාව සම්බන්ධව ඔක්තෝම්බර් මාසයේදි නිර්දේශයක් එනවා කායවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවිම සඳහා ඒවගේම දෙසැම්බර් මාසේ වෙනකොට එය ජයගත් පුර පාරම් පෙර පාසැල ස්ථාපනය කරන්න කියලා නිර්දේශයකුත් වෙලා තියෙනවා. මෙහි සත්‍ය වශයෙන්ම මොකක්ද සිදුවෙන්නේ කියලා පැහැදිලි කිරිමක් ඇති කර ගන්න ඕන. ඒවගේම පාරම් පෙර පාසැල වහලේ තියෙන අලුත්වැඩියාව නිසා එම ස්ථානයේ සේවි ආයතනය පිහිටුවනවා 2020 අගෝස්තු මාසේ වෙනකොට. එතකොට මේ වෙනවිටත් අවුරුදු 1 ½ ක කාලයක් ඒ ස්ථානයෙන් බැහැරව සේවි ආයතනය තුල තමයි මෙම පෙර පාසැල ක්‍රියාත්මක වෙන්නේ. ඒ වගේම වසරක කාලයක සිට ප්‍රජා මධ්‍යස්ථානයක්, ළමා හා මාතෘ සායන පිහිටි ගොඩනැගිල්ලත් සංවර්ධනය කරන්න වැඩ සටහනකුත් මේ තුල ක්‍රියාත්මක වෙනවා. මේ සංවර්ධනයෙන් මේ වෙනකොට සිද්ධ වෙලා තියෙන්නේ පහල මාලයේ අලුත්වැඩියාවන් විතරයි. ඒවගේම වහල අලුත්වැඩියා කර ගැනිමෙන් පසුවත් ප්‍රදේශයේ යම් කිසි ඇබැද්දියක් සිදු වෙලා තියෙනවා. මේ කාරණාව සම්බන්ධව පැහැදිලි කිරිමක් කරන්න. ඒ සඳහා 2020 ඔක්තෝම්බර් මාසයේ යෝජනාවක් ඉදිරිපත් කරලා තියෙනවා ජනතා විමුක්ති පෙරමුණ මන්ත්‍රිතුමිය ඒ සඳහා පුටු ලබා දෙන්න කියලා මේ වෙනවිටත් ඒ පුටු ටික ලබානුදුන්නා කියලා තමයි අපි දැනුවත් වෙලා තියෙන්නේ. අපි කියන්න කැමතියි මේ සම්බන්ධව කාරණා ගණනාවක්. කමිටුව තුල සැහෙන කාලයක් තුල ඇදෙන කාරණාවක් ඒ සංවර්ධන වැඩ සටහනත් තවම සාර්ථකව ක්‍රියාත්මක වෙලා නැහැ. එවගේම පුටු 45-50 වගේ බොහෝම සුලු මුදලක් යන දෙයක් ලබා දිමට විශේෂයෙන්ම එම ප්‍රදේශයේ ගැබිණි කාන්තාවන් සඳහා ඒ පුටුටික ලබාදිමටවත් අසමත් වෙලා තියෙනවා. ඒ සම්බන්ධව ඔබතුමාගෙන් පැහැදිලි කිරිමක් බලාපොරොත්තු වෙනවා. ඒවගේම මෙය පිහිටුවිමට කොපමණ ඉලක්ක ගත කාලයක් ඔබතුමාට තියෙනවද කියන එකත් බලාපොරොත්තු වෙනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, මම හිතන්නේ මෙය විශේෂයෙන්ම ප්ලාස්ටික් පුටු ලබාදීමේදී ඉඩකඩ ප්‍රමාණයත් එක්කම ගලපාගෙන ඒ පුටු ප්‍රමාණය අඩක් අඩුකරගෙන හරි කමක් නැහැ ලී පුටු වලට යන්න ඕනයි කියන විශ්වාසය දැඩි ලෙස මා ඒ තුල ඉන්නවා. ප්ලාස්ටික් පුටු කැඩෙන්න පුලුවන් ලිස්සලා කැඩෙන්න පුලුවන් ජීවිත එකක් නොවෙයි ජීවිත දෙකක් එක්ක ඉන්නේ. සමහර විට දරුවෙක් මෙලොවට බිහිකරලා සායනයට යන්නත් පුලුවන් බිහි කරන්න ඉන්න එක්කෙනා සායනයට යන්නත් පුලුවන්. ඒනිසා විශේෂයෙන්ම මේ නිසා මම හිතනවා මොරටුව මහ නගර සභාවේ යකඩ බඩු ගේන්නේ නැහැවගේම ප්ලාස්ටික් ඒවත් නැති කරන්න ඕන විශේෂයෙන්ම මොරටුව අපි. නුවරඑළිය ලී වලට යනකොට මොරටුව යකඩ, ප්ලාස්ටික් වලට යන්න බැහැ. එම නිසා ඔබතුමාගේ මේකේදි අපි තවදුරටත් කල්පනා කරලා හැසිරවීමට හැකි වෙන්නාවූ පුටු හදන්නත් ඒවා දැව වලින්ම හදන්නත්. එහෙම හදන්න බැරිනම් පවත්වාගෙන යන්න පුලුවන් පුටු ප්‍රමාණයක් මම හිතනවා තව මාසයක් දෙකක් වගේ කාලයක් ලබාදීමටත් අඩුපාඩු සම්පූර්ණයෙන්ම නිරාකරණය කිරිම කාර්තු ක්‍රමයට වැඩ කිරිම සඳහා මේ අවුරුද්දේ අපි වැඩ කිරිමට පටන් අරගෙන තිබිම නිසා පලවෙනි කාර්තුව අවසාන වන මාර්තු මාසයේ 31ට පෙර මේ අඩුපාඩු සම්පූර්ණ කර සෞඛ්‍ය මධ්‍යස්ථානය හදනවා.

2021.12.07 දින පැවති මහජන උපයෝගිතා ප්‍රජා සංවර්ධන ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම තිරණයන් එකමතිකව සහා සම්මත විය.

06(04) 2021.12.08 දින පැවති පරිසර, සෞඛ්‍ය සනිපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන් සලකා බැලිම.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, රසායනාගාරය වාර්තාව මේයට ඇතුලත් වෙලා නැහැ. ඒ පිලිබඳව නොවැම්බර් මාසේ එන්න ඕන.මේ වාර්තා ආයතන කමිටුවෙත්, සෞඛ්‍ය කමිටුවෙත් තිබුන් නැහැ. නමුත් වාර්තාව ලබා දිලා තියෙනවා. කමිටු වාර්තාවට මාසිකව කොච්චර ප්‍රමාණයක් රසායන කටයුතු කරාද කියන වාර්තාවක් එනවනේ අපිට එකට අදාල විස්තර ටික මෙවර වාර්තාවට ඇතුලත්වෙලා නැහැ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, පරීක්ෂණ කරන මහත්මයාට කොවිඩ් හැදිලා මාසෙම ඒවා කර ගන්න බැරිවුනා.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඒ මහත්මයා කිව්වේ භාර දුන්නා කියලා තමයි.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා,_ ඊලඟ කමිටු වාර්තාවට ගන්න පුලුවන්.

<u>මහ නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පරිසර හා සෞඛ්‍ය අයිතමය යටතේ මේ කමිටුවට අදාලව නොවුනත් කල්දේමුල්ල ර්බට් පටු මගේ තියෙනවා ප්‍රජා ශාලාවක් මේකේ වසර ගණනාවක පටන් මාතෘ හා ළමා සායනයක් පවත්වාගෙන ගියා.නමුත් මේවෙනකොට එක ක්‍රියාත්මක වෙන්නේත් නැහැ. ප්‍රජා ශාලාව සම්පූර්ණයෙන්ම වහලා මම හිතන්නේ ඉබ්බා මාස ගණනාවකින් ඇරලා නැහැ ගේට්ටුවේ පධාන දොරටුව මොකද කල්දේමුල්ල ප්‍රදේශයටත් එවගේම එ කොට්ඨාශයටත් එ අදාල කොට්ඨාශවල එ ගැබිණි මාතාවන් එ දූවා දරුවන් මේ සායනයට සම්බන්ධවෙලා කටයුතු කරා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, අපි කමිටු වාර්තා කථා කරද්දි කමිටුවේ වාර්තාවේ නැති එකක් කථාකරන්න එපා . අපි දැන් ලිහිණි මන්ත්‍රීතුමිය එහෙන් කියනවා වාර්තා එපා ලැප්ටොප් එකක් දිලා හරි මේ තොරතුරු එකතු කරමු කියලා.ඔබතුමා ඔක පුද්ගලික ස්භාවයේ කරුණු යටතේ හරි එහෙම නැත්නම් වෙනත් කරුණු යටතේ හරි ඉදිරිපත් කරන්න.කමිටුවේ නැති එකක් කථා කරන්න එපා.මොකද හේතුව කව්ද උත්තර දෙන්නේ මෙවට

<u>මහ නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම කියන්නේ කරගන්න කථාව නෙමෙයි.ඇයි දැන් එක වහලා තියෙන්නේ.එ නිළධාරිතුමියක් ඉන්නේ.ඇයි එතුමියට එතන ස්ථානය නැතිකරලා තියෙන්නේ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, සායනයට අවශ්‍ය පහසුකම් ඔක්කොම ටික දෙන්නේ අපි.නිළධාරින්ව එතනට යොමු කිරිම එතනට පවත්වාගෙන යන්නේ MOH කාර්යාල වලින්.අපිට තියෙන්නේ පහසුකම් සැපයිම විතරයි. කරුණාකරලා අහන්න මොකද කරලා තියෙන්නේ කියලා. අහලා මටත් කියන්න මෙන්න මෙහෙම දෙයක් නිසා පහසුකම නැති නිසා වෙන්නේ නැහැ කියලා කියනවානම් මම හදාගන්නම්. මම දිලා තියෙන්නේ සියලුම සෞඛ්‍ය මධ්‍යස්ථානවලට පහසුකම් පමණයි.මෙය පවත්වන්නේ අපි නෙමෙයි. MOH කාර්යාලවලින් පවත්වාගෙන යන්නේ වෛද්‍යවරයෙක් අපිට නැති නිසා. මට වෛදයවරයෙක් හම්බවුන දවසට ඔය උත්තරය දෙන්නේ නැහැ. උදාහරණයකට මම කියන්නම් නාගරික මන්ත්‍රීවරයෙක් වෙලා ඉන්න කාලේ විල්ලෝරාවත්ත සෞඛ්‍ය මධ්‍යස්ථානයේ පවුල් සෞඛ්‍ය සේවිකාව මට කිව්වා මේකේ වතුර නැති නිසා කරුණාකරලා අපි සායනය නවත්වනවා. ඊට පස්සේ අහල පහලින් මම රුපියල් 7000 ක් හොයාගත්තා වතුර ටැංකිය දැම්මා මටත් ටිකක් පයිප්ප වැඩ පුලුවන් මම ම කරාමේ වැඩ කරලා වතුර දුන්නා ඊට පස්සේ එ නෝනා නැවතුනා සායනයේ එවගේ පොඩි වැඩක්ද දන්නැනේ තියෙන්නේ කරලා දාන්නකෝ.

2021.12.08 දින පැවති පරිසර, සෞඛ්‍ය සනිපාරක්ෂාව පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම තිරණයන් එකමතිකව සහා සම්මත විය.

6(5) 2021.12.08 දින පැවති ක්‍රිඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයක් සලකා බැලිම.

**මහ නගර සභා මන්ත්‍රි - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා**

ගරු නගරාධිපතිතුමනි, 2(1) සම්බන්ධව පොඩි පැහැදිලි කිරිමක් අවශයි 2 (1) ට අදාලව මීට පෙර නිර්දේශයක් තිබුනා නාගරික සංවර්ධන අධිකාරියත් සමඟ සාකච්ඡා කර සංවර්ධනය කිරිම සිදු කරන්න නමුත් මෙහි සඳහන් වෙනවා 2021.03.10 දින කමිටු නිර්දේශයෙ සඳහන් නිර්නායක පදනම් කර ගනිමින් ප්‍රතිසංස්කරණය කිරිමට. නමුත් මෙහි ඇමුණුම 3 හැටියට නාගරික සංවර්ධන අධිකාරිය විසින් එවන ලද ලිපියේ ඩික්සන් ජේ පීරිස් ක්‍රිඩාංගන සම්බන්ධ සඳහන් වීමකුත් සඳහන් වෙනවා. මේ පිලිබදව ඔබතුමා පැහැදිලි කිරිමක් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රිතුමා, විශේෂයෙන්ම යහපාලන රජය කාලේ ඉදිබැද්ද ක්‍රිඩාංගනයත් ජයගත්පුර ක්‍රිඩාංගනයත් සංවර්ධන කටයුතු සිදු කරන මොහොතේ ජයගත්පුර ක්‍රිඩාංගනයේ මම දිගින් දිගටම ඔවුන්ගෙන් ඉල්ලුවා ජයගත් පුර ක්‍රිඩාංගනයේ අවශ්‍යතාවය ලබා දෙන්න ඒ නිසා කරුණාකරලා ඉතිරි මුදල ඒ මිලියන 3 අපට ලබාදෙන්න ජයගත්පුර ක්‍රිඩාංගනයට කියලා. ජයගත්පුර ක්‍රිඩාංගනය අපට පුලුවන් තරමින් අපි ඒක ඩිවලොප් කරා. අපිට පුලුවන් නම් හැකි ප්‍රමාණයෙන් තවත් ඒක විකට් එක හදලා තියෙනවා.තැනින් තැන පොඩ්ඩක් කිඩා කරන්න පුලුවන් තත්වයට පත්කරා.ඩික්සන් පිරිස් කියන නම විතරක් මේකට ඇතුලත් වුනාට ඩික්සන් පිරිස් ක්‍රිඩාංගනයට මොන විධියවකින්වත් අපි එවෙලාවේ කථා කරේ නැහැ මොනවිධියෙන්වත්.සාක්ෂිය තමයි සජිත් දුමින්ද පිරිස් මන්තිතුමා දන්නවා.අපි කථා කරේ නැති හේතුව එවෙනකොට ඉදිබැද්ද ක්‍රිඩාංගනය භාවනා යෝගිවගේ මට්ටමට ගිහිල්ලා ව්‍යායාමේ යෙදෙන්න.යෝග ව්‍යායාම්වල යෙදිම සඳහා අවශ්‍ය කරන විදියට එතන හදන ගොඩනැගිල්ලත් එක්කම සාපෙක්ෂව ගොඩනැගිල්ලත් එක්කම එක හදන එකයි ක්‍රිඩාංගනයට යම් කිසි හානියක් සිදු වුනා.දිගින් දිගටම අපි ඉල්ලිමක් කරා මේ මිලියන තුන ලක්ෂ 30 දෙන්න කියලා අපිට පහුගිය දවස්විකේ අපිට කොමසාරිස්තුමයි එ අදාල වෙන නිළධාරිනුයි ගිහිල්ලා සාකච්ඡා පැවැත්විමේදි අපිට මේවෙනකොට මිලියට 3 ට අමතරව ලක්ෂ 30වෙනුවට ලක්ෂ 32 මුදලක් අපිට එවලා ඉවරයි.ඉදිබැද්ද ක්‍රිඩාංගනයේ එවට ඇස්තමේන්තුත් හදලා ඉවරයි.ඩික්සන් පිරිස් ක්‍රිඩාංගනය කියන එක උඩින් තිබුණාට මේවට සාකච්ඡාවක් අපි කරේ නැහැ.නමුත් අපි මෙවර ක්‍රිඩාංගන නවිකරන වැඩ සටහනක් ඉතාමත් ඉක්මණින් කරලා ඩික්සන් පිරිස් ක්‍රිඩාංගනයත් එ කටයුත්තත් අපි සිදුකරනවා

**මහ නගර සභා මන්ත්‍රි - සිත්ති මසීනා බක්කර් මහත්මිය**

ගරු නගරාධිපතිතුමණි මට පැහැදිලි කිරිමක් කරගැනිමට අවශයයි සොයිසාපුර ක්‍රිඩාංගනය සම්බන්ධව සොයිසාපුර ක්‍රිඩාංගනය කවදාද හදන්න පටන්ගත්තේ

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, මේ වෙනකොට අපි කියපු තණකොල කපන මැෂින් එක මේවෙනකොට ට්‍රැක්ටරයට සවිකරලා ඉවරයි.හෙට දිනයේදි මම හිතනවා අපිට ඉස්සේල්ලාම ආරම්භ කරන්නේ සොයිසාපුර ක්‍රිඩාංගනයේ තණකොල කපන මැෂින් එක පැය එකාමාරක් දෙකක් ඇතුලත සම්පූර්ණයෙන්ම අපි කරනවා අපේ ගරු මන්ත්‍රිවරුන්ගේ විද්‍යාලවල තමන්ගේ ගෞරවය ලබාගන්නා පරිදි එකට අදාල වෙන්නාවු තෙල් හා යම් කිසි මුදලක් සභාව නඩත්තුකරන්න නෙමෙයි එ රථයේ තෙල් ටිකයි නඩත්තු කරන්න පොඩි මුදලක් අය කරලා සම්පූර්ණයෙන් කපනවා. මම හිතන්නේ ගවුන්ඩ් දෙක තුනක් දවසට කපලා ඉවර කරන්න පුලුවන් වෙන යන්ත්‍රය ගෙනල්ලා සවිකරලත් ඉවරයි.තණ කොල කපන මැෂින් එක ක්‍රියාත්මක වෙනවා වගේම එකට අවශ්‍යවෙන පස් අරවා මේවා දාලා අපි පොඩි සංවරධන කටයුත්තක් කරන්න හිටියා මේපැත්තේ ඔඩිටොරියම් එක හදන්න එන කියලා ඔඩිටොරියම් හදනකොට ගලවන මේක දිගින් දිගටම කථා කරාට ක්‍රියාත්මක වෙන්නැ කිව්වාට අපිට තියෙනවා කථාකරන ගරු මන්ත්‍රිතුමා කථාකරන්නේ අදාල ප්‍රශ්ණයට අදාල ප්‍රශ්ණය එ විදියටම ක්‍රියාත්මක කරන්න පරිපාලකයෝ විදියට අපිට බැහැ.අපිට එකකින් අයින්වෙනදේ තව තැනකට ගෙනියන්න බලාගෙන හිටියට අද දිනයේදි නාගරික සංවර්ධන අධිකාරිය ගරු ආණ්ඩු පක්ෂ මන්ත්‍රිවරුත් එක්ක සාකච්ඡාවකට එනවා ඔඩිටොරියම් එක වෙනත් තැනකත් හදලා අලංකරණ මුහුදු වෙරලක් හදාගෙන එවා කරනකොට මේවා දැන් ගලවන්න පුලුවන් කම ලැබෙන්නේ නැහැ.එ නිසා අපි එතනට අලුතෙන්ම එ හට් එක හදලා ඔකේ තව එකක් එකතුවෙනවා අපේ ඔසද හර්ෂණ මන්ත්‍රිතුමාගේ ලොකු ඉල්ලිමක් තියෙනවා බාස්කට් බෝල් කොඩ් එකක් හදන්න ඔන කියලා.අපි ස්පොට් කමප්ලෙක්ස් එකක් හදනවා ලබන අවුරුද්දේ මැයිවෙන්නට පෙර.එතන බාස්කට් බෝල් කෝට් එක එතන බැඩ්මින්ටන් කෝට් එක එතන කාය වර්ධන එක හා ඉන්ඩෝ විකට් එක.මේ ඔක්කොම හදලා අපි ඉවර කරනවා ලබන මැයිවලට පෙර. අපි හැවිද්දේ මේ මේ ටෙන්ට්ික ගෙනහිල්ලා එතන හයිකරන්න එනිසා මැයිවෙනකම් කාලේ දෙන්න හෙට දිනයේදි තණකොල ඔක්කොම ටික කපනවා.

2021.12.08 දින පැවති ක්‍රිඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම තිරණයන් එකමතිකව සභා සම්මත විය.

06(6) 2021.12.09 දින පැවති කර්මාන්ත හා ඉදිකිරිම් පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන් සලකා බැලිම.

<u>මහ නගර සභා මන්ත්‍රි - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමණි, කර්මාන්ත කමිටුවේ අංක 3(1) සිට 3(6) දක්වාත් 4 (1)සිට 4(98) දක්වාත් අපේ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. විශේෂයෙන්ම මෙම සියලුම කර්මාන්ත ආවරණ අනුමැතියට යටත්ව සිදු කිරිමට තිරණය කරපු නිසා අපේ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා.

<u>මහ නගර සභා මන්ත්‍රි - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමණි කර්මාන්ත කමිටුවේ බොහෝ ව්‍යාපෘති පිළිබදව අපිට එකග වෙන්න බැරිකමක් තියෙනවා. මොකද මොරටුවේ මාර්ග ලෙස ගත්තත් මේවායේ තියෙන්නේ පුලුවන් තරම් මාර්ගවලට මුදල් හලන එක හැබැයි එ මුදල් හලන එක ඇතුලේ වුනත් අපි යන හැම පාරකම යාගන්න බැරි මට්ටමටම අබලන්වෙච්ච පාරවල් ගොඩක් තමයි දෛනිකව

දකින්නේ.එනිසා ව්‍යාපෘති ලෙස වෙන වෙනම අරගෙන ඔබත් එක්ක සංවාදකරගන්න වෙලාවකුත් නෙමෙයි. අපි කාලය ගන්නේත් නැහැ. නමුත් මේ ඇස්තමේන්තුව ඇතුලේ අපි බලාපොරෝත්තුවෙන ප්‍රධාන ජනයා වැඩිපුර භාවිතා කරන අති විශාල මාර්ග පද්ධතියක් අද යන්න බැරි තත්වයට පත්වෙලා තියෙන නිසා.කර්මාන්ත කමිටුවට අපි අපේ විරුද්ධත්වය පල කරනවා.

2021.12.09 දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු තිරණයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රිවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.

| | | | |
|---|---|---|---|
| 01 | නගරාධිපති | - | ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 02 | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 03 | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 04 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 05 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 06 | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 07 | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 08 | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා |
| 09 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ඩබ්.ඩී.රන්දු නිරෝෂණ මහතා |
| 10 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 11 | මහා නගර සභා මන්ත්‍රී | - | පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 12 | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 13 | මහා නගර සභා මන්ත්‍රී | - | පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 14 | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 15 | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා |
| 16 | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ලලිත් ප්‍රනාන්දු මහතා |
| 17 | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 18 | මහා නගර සභා මන්ත්‍රී | - | එෆ්.බී.නිලංක සිල්වා මහතා |
| 19 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කේ.පී සුසන්ත පෙරේරා මහතා |
| 20 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 21 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කුමාර රාජරත්න මහතා |
| 22 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.පිලිප් ෆැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 23 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 24 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 25 | මහා නගර සභා මන්ත්‍රී | - | එච්. උජිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා |
| 26 | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.දීපා චාන්දනී ආරියවංශ මහත්මිය |
| 27 | මහා නගර සභා මන්ත්‍රී | - | රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා |
| 28 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.මැක්සි ජේ ප්‍රනාන්දු මහතා |
| 29 | මහා නගර සභා මන්ත්‍රී | - | සුනිල් නන්දසිරි මාසකෝරාල මහතා |
| 30 | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 31 | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 32 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍ර ගාමිණී පීරිස් මහතා |
| 33 | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.එම්.ඒ.දෝන දිලාශිනී මහත්මිය |
| 34 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුදර්ශණී ප්‍රියන්තිකා කුරේ මහත්මිය |
| 35 | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |

2021.12.09 දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 03(01) සිට 03(06) දක්වාත්, අංක 04(01) සිට 04(98) දක්වා තිරණයන්ට විරුද්ධවත් අනෙකුත් සියලු කමිටු තිරණයන්ට පක්ෂවත් පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.

| | | | |
|---|---|---|---|
| 01 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා |
| 02 | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 03 | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 05. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 06. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය |
| 07. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.ක්‍රිෂනි ප්‍රනාන්දු මහත්මිය |

2021.12.09 දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලු කමිටු තිරණයන්ට විරුද්ධව පහත නම් සදහන් මහා නගර සභා මන්තිවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.

| | | | |
|---|---|---|---|
| 01. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දුමහතා |
| 02. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |

2021.12.09 දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලු කමිටු තිරණයන් වැඩි ඡන්දෙන් සභා සම්මත විය.

(මෙම අවස්ථාවේ දී මහා නගර සභා මන්ත්‍රී යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා සභා ගැබෙහි නොසිටියහ.)

06(07) 2021.12.09 දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමණාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන් සලකා බැලීම.

2021.12.09 දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමණාකරනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු තිරණයන් එකමතිකව සභා සම්මත විය.

06(08) 2021.12.10 දින පැවති ඵලදායිතාව සහ මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන් සලකා බැලීම.

2021.12.10 දින පැවති ඵලදායිතාව සහ මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම තිරණයන් එකමතිකව සභා සම්මත විය.

06(09) 2021.12.13 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තීරණයන් සලකා බැලීම.

**<u>මහ නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමණි, මුදල් කමිටුවේ අංක 9(1) මාතෘ සායනය සඳහා ගෙවීම් අනුමත කරනවා 26832.00ක් ගර්භනි මව්වරුන් සඳහා කිරිපැකට් වලට 26832.00 ක් අනුමත කරනවා නොවැම්බර් මාසයට වැය ලේජරයේ එක ගෙවීමක් සිදුකරනවා 27712.00ක් වෙනසක් තියෙනවා.එකට මොනවා හරි හේතුවක් තියෙනවාද අනුමත කරන්නේ 26832.00ක ගෙවීම් කරනවා 27712.00ක් නොවැම්බර් මාසයට එක ලබන සැරේට නිවැරදි කිරීමක් කරන්න.ඊට අමතරව මට පැහැදිලි කිරීමක් කරගන්න ඕනේ වරිපණම් බදු සම්බන්ධයෙන් නිදහස් කිරීම සම්බන්ධව පිටු අංක 74 වරිපණම් නිදහස් කිරීමේ කමිටුවේ නිර්නායකයන් දීලා තියෙනවා.2020 සහා 2021 සඳහා පවත්නාවු කොවිඩ් වසංගත තත්වට අනුව වසා තිබූ ව්‍යාපාර සඳහා අපි බදු නිදහස් කරනවා කියලා.ඒ අතරතුරේදි අපිට පෙනවා අංක 24(5) (6) (8) (15)එවා අදාල වෙන්නේ 2016-2018 දක්වා.නමුත් දැන් තමයි දෙසැම්බර් මාසේ 21ට අපි බදු නිදහස් කරන්න හදන්නේ.එතකම් අපිට මොකක්ද වෙලා තියෙන්නේ 2018 පස්සේ මේ ව්‍යාපාර පවත්වාගෙන යනවාද එවට බදු ගෙවලාද ඇයි මේච්චරකල් පරක්කුවුනේ.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය, බදු සහන බදු නිදහස්කර ගැනිම ඕන කෙනෙකුට ඉල්ලන්න පුලුවන් තමන්ගේ ව්‍යාපාරය පවත්වාගෙන යන්නේ නැත්නම් ඉල්ලුවාම එකෙදි කොවිඩ් එකත් එක්කම අවුරුදු එකාමාරක් විතරම අපි ඉල්ලපු බදු කප්පාදුව ලබාදෙන්න බැරිවුනා. කමිටු තිබ්බේ නැහැ. සමහර විට මාස 04 විතර නිළධාරි ආවේත් නැහැ. එකේදි සමහර වේලාවට ඔය කියන එවායේ සහනය දුන්නාට පටන් අරගෙන නැවත වැය ලේජර් එකේ ඔවුන්ගේ ව්‍යාපාරය තියෙන්නත් පුලුවන්. ඉල්ලපු කාල සීමාවට අදාල වෙන්නාවු කාරණය අරගෙන ලයිට් බිල් වතුර බිල් අරගෙන ව්‍යාපාරයේ ස්භාවයත් එක්ක අරගෙන බදු නිදහස් කිරීම කරනවා. ඊට අමතරව 2020 2021 කියන එක විශේෂ කාලයක් ලෙස සලකලා එකාලේදි සමහර අය ව්‍යාපාරය නවත්තලා තියෙනවා. ඒ නවත්තපු එකට විශේෂ දෙයක් කරලා මේ කොවිඩ් එක කියලා ගත්තා 2020 ට 2021ට සාමාන්‍ය ක්‍රමවේදයක් සමහර විට ඉල්ලන්න පුලුවන් මම 2015, 2016, 2017 මේ ව්‍යාපාරය කලේ නැහැ. එක නිසා සහනය දෙන්න ආයේ මම පටන්ගත්තා 2019 එතෙක් ඉදලා බදු අය කරන්න කියලා ඉල්ලන්න පුලුවන්. එතකොට එයාගේ තියෙන්නාවු ලිපි ලේඛන චෙක් කරලා එක නිවැරදිනම් සහනය දෙන්න වෙනවා. එක ඇවිල්ලා අපේ අනපනත් වල තියෙන්නාවු කාරණයක් කෙනෙක්ගේ ව්‍යාපාරයක් වැටිලා තියෙනවානම් ව්‍යාපාරය පවත්වා ගන්නැත්නම් එක ලිඛිතව සභාවට දන්වලා තියෙනවානම් අපේ වැරුද්දක් වෙන්න පුලුවන් පමාදවීම නමුත් ඔහුට ඒ අයිතිය ලබාදිය යුතු වෙනවා. එනිසා එහෙම කරපු ටිකක් තමයි ඔබතුමා අංක 24(4), (5), (6), (7) කිව්වේ.ඊට පස්සේ අපි සභාවට දාලා අනිවාර්යෙන්ම 2020 2021 කියන අය ව්‍යාපාරය නවත්තලා තියෙනවානම් ඔවුන්ට විශේෂිතවූ සැලකිල්ලක් සේ සලකලා කටයුතු කරනවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය.</u>**

ගරු නගරාධිපතිතුමණි, ව්‍යාපාරිකයන්ට අපි අතහිත දෙන්න ඕනැ, නමුත් මේ පරණ 2016 එවා ටිකක් අපි කල්වෙලා ඇතිව අපි හොයා ගත්තානම්

නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා

ගරු මන්ත්‍රීතුමිය, සමහර විට මේ වෙනකොට එගොල්ලෝ සහනය ඉල්ලපු කාලේට අපි දුන්නේ එතක් ඉදලා දිගටම දෙන්නේ නැහැ. ඊට පස්සේ ඔහු පටන් අරගෙන තියෙනවානම් 2017 නැවත ලේජර් එකේ එයාගේ ව්‍යාපාර බදු අය කරනවා.එක දිගටම දෙන්නේ නැහැ. ඉල්ලපු කාල හෝරාවට විතරයි දෙන්නේ අවුරුද්දනම් ඉල්ලා තියෙන්නේ අවුරුද්දට දුන්නා. ඊට පස්සේ ආයේ අයකරා. එහෙම ඔන තරම් තියෙනවා. සේශාන් කියලා තියෙන ව්‍යාපාරය ලක්ෂපතිය පාරේ එගොල්ලෝ කාලේකට ඉල්ලුවා එ කාලේ නිදහස් කරා. දැන් පටන් අරගෙන ආයේ අපිට බදු ගෙවනවා. එක නිසා දෙන්නේ සහනය ඉල්ලපු කාලයට විතරයි.

මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දූමින්ද පීරිස් මහතා

ගරු නගරාධිපතිතුමා කසල සම්බන්ධයෙනුත්කොවිඩ් කාලේ සහනය කියාත්මක වුනා නේද.

නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා

ගරු මන්ත්‍රීතුමා, එකත් කියාත්මක වුනා පොල් කට්ටෙන් බද්ද නිදහස් එක අපි කොහොම හරි කරනවා. එකත් අපි පටන්ගන්නවා කාඩ් 1000 විතර ගහන්න වෙනවා කාඩ් ටික ගහලා පටන්ගන්නවා.

මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දූමින්ද පීරිස් මහතා

ගරු නගරාධිපතිතුමා මුදල් කමිටුවේ ඔබකිව්ව කාරණය පිළිබද පොඩි පැහැදිලි කිරිමක් කරගන්න පුලුවන්නම් හොඳයි අපේ අර මේ පළාත් ආදායම් බදු එකට ගෙව්වාට පස්සේ අපිට එක්කොටි විසිනම ලක්ෂයක අර ගෙවිමක් කරලා නැත්තේ එගෝල්ලො එ ටි එක හරවා ගන්න ආපු අවස්ථාවේ රිසිට් එක තිබ්බේ නැති නිසාද එහෙම නැත්නම්

නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා

ගරු මන්ත්‍රීතුමා, අපිට ඇත්තටම කියනවානම් එක අපි ගිහිල්ලා උපලේඛන පරික්ෂා කිරිමේදි මෙම මුදල අපිට හම්බවුනා හම්බෙලා ඉල්ලන්න යනකොට වරිපණම් ලේඛණය හැදිලා ඉවරයි.බරපතල විධියට අපි මේක පටන් ගත්තේ 2020 න් පස්සේනේ.2020 පස්සේ මුදාව තියන්න ඔන අපි මේක පටන් ගත්තේ.2019 කියනකොට අපි මේක පටන්ගෙන තිබ්බේ නැහැ.එතකොට එ ටි එක හැදිලා නමුත් එතනදි නොතාරිස් විසින් හිතාමතාම රිසිට්පත අලවලා යවලා නැහැ. රිසිට්පත අලවලා නැතිවුනාම එක ගෙවිම නියමිත පරිදි එවලා තියෙන වාර්තාවේ එ ටි එක හරවා ගැනිමේ වාර්තාවේ සදහන් වෙලා තියෙනවා මිලියන 11 බිංදුවයි 39000 ක් විදියට එවලා තියෙන ගාන එක නිසා අපි එක දැන ගත්තා දැන් අපි එක නිවැරදි කරගන්න රේජිස්ට්‍රාර් ජනරාල් එකට ගිහිල්ලා නිවැරදි කරගෙන එක ගන්නවා.

මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දූමින්ද පීරිස් මහතා

ගරු නගරාධිපතිතුමා පහුගිය අපේ අතපසුවේච්චාවට හිමිකම් පාන්න පුලුවන්ද

නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා

ගරු මන්ත්‍රීතුමා, ප්‍රඥප්තිය අහෝසි කරලා පඥප්තිය අහෝසි කරනවා කියන්නේ කාලාවරෝදය ඉවත්වෙනවා.එතකොට අතිතයට ගිහිල්ලා කතාලාවරෝදයත් එක්ක ගන්න බැරිවෙච්ච ඔක්කොම ටික ගත්තැකි.

**<u>මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමා එතකොට එකට යන්න පුලුවන් කාලාවරෝදය ප්‍රශ්ණය පඥ්ඥප්තියෙන්

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, එක නැතිවුනත් 2019 නිසා 2022 අවසානයේ වෙනකම් පුලුවන්

**<u>මහ නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමණි, ඇමුණුම 03 වැය ලේජරය සම්බන්ධයෙන් පොඩි පැහැදිලි කිරිමක් අවශ්‍යයි.මේ වැය ලේජරයේ වියදම් පතිශතය සමහර කොලම්ස්වල තියෙනවා ගරු නගරාධිපතිතුමණි සියයට සිය ඉක්මවා ගිහිල්ලා සමහර එවල පතිශතය කියන කොලම් එකේ දෝෂ තියෙනවා එ කියන්නේ පතිශතය නිවැරදිව සදහන් වෙලා නැහැ.මේවල සියයට සයයක් ඉක්මවා ගිහිල්ලා තියෙන එවට ලබාදෙන එක්ස්පනේෂන් එක මොකක්ද කියලා දැනගන්න කැමතියි අතිකාල සදහා මිලියන 3.2 ක් වෙන් කරලා තිබ්බාට මිලියන 5 ක් වියදම් කරලා තියෙනවා.එවගේ අවස්ථා ගණනාවකදි තියෙනවාගබජට් එකත් එක්කනේ මේක කම්පෙයා කරලා යන්නේ.ගරු නගරාධිපතිතුමණි විගණනයට ගියාම මේවා තමයි පශ්ණ වෙන්නේ.මේවලට එක්ස්පලේෂන් තියෙනවාද කියලා මම දැන ගන්න කැමතියි.වාර්තාවේ වැරදි තියෙනවා.අවසාන කොලම් එක වියදම් පතිශතයේ සදහන් කරලා තියෙනවා වැරදි එය නිවැරදි විය යුතුයි.නගරාධිපතිතුමණි.12(1)මෙතන නගරාධිපතිතුමණි 12(1) සම්බන්ධයෙන් අපි වාර්තාවක් ඉල්ලන්න කැමතියි.මේකේ දැන්විම් පුවරු ආදායම අට ලක්ෂයක් නොවැම්බර් මාසයේ තිරෝද රථ ගාල් ආදායම 1500 ක් කියලා තියෙන්නේ එක විය නොහැක්කක් නෙද නගරාධිපතිතුමණි.මොරටුවේ තිරෝද රථ ගාල් ආදායම් මිට වැඩිය වැඩි සංඛ්‍යාවක් තියෙනවා කොහොමද 1500 වගේ මුදලක් ආවේ 12(1) සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කරන්න කියලා ඉල්ලිමක් කරන්න කැමතියි.මෙකේ තියෙන දත්ත පිළිගන්න බැහැ නගරාධිපතිතුමණි.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය, පිළිගන්න බැරිවුනාට තියෙන දත්තනේ දෙන්න වෙන්නේ.වේලා තියෙන්නේ මන්ත්‍රීතුමිය සමහරවිට 1500 වත් නැතිවෙන්න පුලුවන්. ත්‍රිරෝද රථ රියදුරන් ඇවිල්ලා ඔවුන් සමහර වේලාවට හිතෙනවා මුල ගෙවන්න ඔන කියලා සමහර අය කියනවා තව ත්‍රිවිල් පාර්ක් එකක් අලුතින් පටන් අරගෙන පටන්ගත්ත කෙනා ඇවිල්ලා ගෙවපු එකද දන්නැ ඔය තියෙන්නේ.ගරු මන්ත්‍රීතුමිය මන් කියනදේ පොඩ්ඩක් අහගෙන හයියෙන් උත්තර දුන්නාට කමක් නෑ.ඔබතුමිය හයියෙන් අහගෙන හයියෙන් උත්තර දෙන්න ගියාම මේක පැටලෙනවා.ගරු මන්ත්‍රීතුමිය සමහර අය හිතනවා වාර්ෂික බලපත්‍රනේ මේ අය කරන්නේ.එතකොට ජනවාරි මාසයේ අය කලාම එගොල්ලෝ හිතනවා එගෝල්ලෝ දෙසැම්බර් මාසේ ගෙව්වත් ගෙවන්නේ මාසයකට ත්‍රිවිල් පාර්කින් එකක් කවුරුහරි අය කරාම මාසික එකක් අපේ නෑ.ගෙවන්නේ වර්ෂයට එතකොට සමහරවිට එක පාර්කින් එකක් ඇවිල්ලා ලියාපදිංචිවෙන්න ඇති දෙසැම්බර්වල.එතකොට එකේ ගාන 1500.00යයි.

**<u>මහ නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමණි, 26 වෙනි කරුණ සම්බන්ධයෙන් ගණකාධිකාරි විසින් සහා ආවරණ අනුමැතිය යටතේ වරිපණම් බදු පරිගණකයෙන් කපා හැරිම සම්බන්ධයෙන් කරන කරුණ පරිගණකයෙන් කපා හැරිමට ඉල්ලිමක් කරනවා ගරු නගරාධිපතිතුමණි. මෙවගේ ඉල්ලිමක් කරන එක වැරදි මොකද යම්කිසි දෙයක් තියෙනවානම් පරිගණකයෙන් කපා ඉවත් කිරිම නෙමෙයි සිද්ධවිය යුතුදේ පරිගණකයේ එන්ට්‍රි එකක් දාන්න ඔන මේ දේ ඉවත් කරන්න

කියලා. අපි මෙතන සභාවෙන් අනුමත කරනවානේ යම් කිසිදෙයකට පරිගණකයේ ඩේටා ඉවත්කරන්න කියන එක එක ප්‍රින්සිපලි වැරදි නගරාධිපතිතුමණි.

<u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රිතුමිය, මේ ඩබල් එන්ට්‍රි තියෙන්නේ.එක දේපලට දෙපාරක් අය කරලා එක කපාහරින්න ඔන.එකතමයි ඔය ඉල්ලන්නැතිව කපන්න බැහැනේ. එක සභාව දුන්නැත්නම් නිලධාරින්ට එ දෝෂාරෝපණය යන්නේ.සභාවේ ආදායමක් ගන්න බැරි ආදායමක් සභාවෙන් තියෙනකොට එය ඉවත්කරන්න ඉල්ලන්න ඔන. නැත්නම් ඔඩිට්කුවරිස් එනවානේ.එනිසා එ ආදායම අයින් කරන්න ඔන.ලබාගන්න බැරි ආදායමක් ඩබල් එන්ට්‍රිස් දාලා අයින් කරන්න ඔන.

<u>**මහ නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමණි 29 නිති නිළධාරියෙකුගේ සේවය ලබා ගැනිමට ඉල්ලලා තියෙනවා. ගරු නගරාධිපතිතුමණි එක පළාත් පාලනයේ අනුමැතියට යටත්වද කියලා දැනගැනිමට කැමතියි.

<u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රිතුමිය, නැහැ පළාත් පාලන ආයතනයට යටත්ව වෙන්න ඔන නැහැ.සභාවේ අවශ්‍යතාවයන් සදහා අපි ඉල්ලනවානම් කෙනෙක්ගෙන් සේවාවක් එ සදහා මුදල් අය කරනවා වගේ අපේ මේ තියෙන තත්වයට ගලපගන්න පුලුවන් විධියට උපදේස් ලබාගැනිම සදහා සභා මේවාරිකය ඉවර කර ගැනිම සදහා අපිට එ බදවා ගැනිම කරන්න පුලුවන්.දිමනාවක් ලෙස ගෙවිමට

<u>**මහ නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමණි 22 සම්බන්ධයෙන් ඔබතුමා මුද්දර ගාස්තු ගැන කථා කරා. මෙතනදි ඔබතුමා අදහස් කරන්නේ නොතාරිස්වරුන්ට යම් කිසි ඉල්ලිමක් කරිමටද කියලා මම දැන ගන්න කැමතියි.හේතුව නොතාරිස්වරු ගත්තාම නොතාරිස් ආඥාපනත යටතේ එගොල්ලන්ට මුද්දර ගාස්තු සම්බන්ධයෙන් වාර්තාවක් දිමට බැදි සිටිනවා.එක සභාවකට පළාත් පාලන ආයතනයකට දිමට වගකිමක් නැහැ නොතාරිස්වරුන්ට එකද ඔබතුමා ඉල්ලන්නේ කියලා දැනගන්න කැමතියි.මේ ලියුමේ තියෙනවා නිශ්චල දේපල පැවතිම සම්බන්ධයෙන් ලේඛන ලැයිස්තුවේ පිටපතක් පළාත් පාලන ආයතනය වෙත අනිවාර්යයෙන් යැවිය යුතුවුවත් එ ආකාරයෙන් සිදුනොවන බැවින් එ පිළිබද නොතාරිස්වරුන් දැනුවත් කිරිම කියලා.එක වැරදි නගරාධිපතිතුමණි මොකද නොතාරිස්වරුන් වගකිමක් බැදේන්නේ නොතාරිස් ආඥාපනතක් තියෙනවා එකට අනුව පළාත් පාලන ආයතනයකට නොතාරිස්වරුන්ට තමුන් සහතික කරන ඔප්පු සම්බන්ධයෙන් දැනුම් දිමට නිතියෙන් සදහනක් නැහැ.

<u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රිතුමිය, ඔබතුමිය දන්නැති එකනේ ඔය කියන්නේ.අනිවාර්යෙන්ම රේජිස්ටාර් ජනරාල් විසින් නොතාරිස්වරුන්ට නිකුත් කරලා තියෙනවා මාසික වාර්තාව අනිවාර්යෙන්ම පළාත් පාලනයට එවන්න කියලා.2021 2011 අංක 04 දරණ නොතාරිස් සංශෝදන පනත මාසික ලැයිස්තු පිටපත් භාරදිම ඉහත සංශෝධන පනතේ 03 වගන්තියට අනුව තම එක් එක් මාසය තුල ලියා සහතික කරන ලැයිස්තුවේ පිටපතක් ඉඩමට අදාලව පළාත් පාලන ආයතනය වෙත පැවරිය යුතු කොමසාරිස්වරු මෙම ලයිස්තුවේ පිටපතක් එම ආයතනය වෙත ලබා දෙන බව පළාත් පාලන ආයතන ප්‍රධානින් මාවෙත දන්වා ඇත.නොතාරිස් ආඥාපනතේ විදිවිදාන

කඩකිරිම එකි 27(1)ආ වගන්තිය යටතේ වරදක්වන අතර ඉහත කි ලැයිස්තුවේ පිටපතක් පළාත් පාලන ආයතන වෙත යැවිම සඳහා ඔබ කාර්යාලයට අයත් කොමසාරිස්වරු දැනුවත් කිරිමට පියවර ගන්නා ලෙස දන්වමි.නොතාරිස් ඔක්කොන්ටම යවලා තියෙන්නේ පිටපත්.මා ඔබතුමියට ඉතුරුටික කියන්නම් කරන්න ඔන දේ ඔබතුමියත් ඔප්පු ලියනවානම්.ඉඩමක වටිනාකම ගුගල් එකෙන් බැලුවාම තියෙන වටිනාකම ලක්ෂ 50 නම් නොතාරිස් 25 ට ලියලා ඉතුරු 25 සල්ලි සියයට එක අරගෙන එතනට යැව්වාට පස්සේ අපි තදියමේ ගිහිල්ලා ගන්න යනවා උපලේඛන බලලා ගන්නේ 25ට විතරයි.එනිසයි අපිට කියන්නේ වාර්තා එවන්න කියලා.එතකොට අපි කියනවා රේජිසිටර් කරන්න එපා මේක වැරදි කියලා.

<u>මහ නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමණි තෑගි ඔප්පු හා විකුණුම්කර වලට වැලිවේශන් එක අනිවාර්යයි.වැලිවේශන් එක අනිවාර්යය වුනාම පළාත් පාලන ආයතන වලට ඔප්පුව ආවාම වැලිවේශන් සිල් එක තියෙනවාද කියලා බලන්න ඔන.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමිය දන්නවාද ඔබතුමිය වගේ අය මොරටුවේ ඉන්නවා. මොරටුව නගරසභාවේ විතරයි මෙහෙම කරන්නේ අපි ඔක බලන්න ඔන නැහැ මතය විමසන්න ඔන නැහැ ඔප්පු ලියන තැන් කි තැනක් තියෙනවාද.

<u>මහ නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමණි මම ඔබතුමාට කියන්න හැදුවේ අපි නොතාරිස්වරුන්ගේ ආඥාපනතේ නොතාරිස්වරු බැදේන්නේ වගකිමක් හැටියට රේජිස්ටාර් ජනරාල් කාර්යාලයට තමුන්ගේ මාසික ලැයිස්තු දෙන එක විතරයි. පළාත් පාලන ආයතනවලට දිමට වගකිමක් නැහැ කියලා.ඔක දැනුම් දිලා නැහැ නොතාරිස්වරුන්ට නගරාධිපතිතුමණි වරිපණම් සම්බන්ධයෙන් මේතුමිය කථා කරා එතන නගරාධිපතිතුමණි ඔබතුමා වාර්තාවක් ඉදිරිපත් කරලා තියෙනවා කමිටුවක් හැටියට බදු නිදහස් කිරිම 2020 හා 2021 සඳහා එතකොට මේතන සමහර ආයතන 2016 2019 වලත් වරිපණම් නිදහස්කරලා තියෙනවා.එතකොට එකත් කමිටු වාර්තාවකට subject of committee disition විය යුතු නැද්ද කියලා මම අහන්න කැමතියි.වාර්තාවේ සඳහන් කරලා තියෙන්නේ 2020 හා 2021 කොරෝනා සමයේ ඔබතුමා කපා හැරිමට තින්දුකරා හැබැයි 2016 හා 2019 කාලය තුලත් වරිපණම් කපා හැරිමට

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, මුදල් කමිටුවට නැතිවුනත් කමක් නැහැ කමිටුවට අනිත් දවසේ එන්න. දැන් මුදල් කමිටුව වේලා තියෙන්නේ.කරුණාකරලා දැන් ඔබතුමියට මසිනා බක්කර් මන්ත්‍රීතුමියට කථාකරලා කියපු එකම තමයි ඔබතුමියට කියන්න තියෙන්නෙත්. ඔබතුමිය එක තේරුම් ගන්නේ නැත්නම් මට තේරේන්නේ නැහැ.

<u>මහ නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමණි මම ඔබතුමාට කියන්නේ 2020 2021 යටතේ කපා හැරිමට ලක් කරනවා නම් කමිටු වාර්තාවකට විශේෂ කමිටු වාර්තාවකට යටත්විය යුතුද නැද්ද යන්න දැනගන්න කැමතියි.

<u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමිය, එක විශේෂ එකක් කරලා කල්පනා කරලා කමිටුවට එන්නැතිව මුකුත් කරන්න බැහැ.ඔබතුමිය ඔක්කොම දන්නවානේ.රුපියලක් අයින් කරන්න බැහැ මුදල් කමිටුව හරහා එන්නේ නැතිව වියදමක් කරන්නත් බැහැ මුදල් කමිටුව හරහා එන්නේ නැත්නම් එක ඔබතුමිය තේරුම් ගන්න.

<u>**මහ නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමණි මම අහන්නේ ඔබතුමා කමිටුවට ඉදිරිපත් කරලා එකේ ඔබතුමා නිර්දේශ ගණනාවක් ඉදිරිපත් කරලා තියෙනවා. ඇමුණුම අංක 37 යටතේ එතන කියලා තියෙන්නේ සහන 2020 හා 2021 ට අදාල වර්ෂවලට ලබාදිය යුතුයි කියලා.එතකොට ඔබතුමා තින්දුවක් අරගෙන තියෙනවා මෙතන 2016 2019 ටත් එ සහන ලබා දෙන්න එතකොට එකත් එකට යටත්විය යුතුද නැද්ද කියලා මම ඔබතුමාගෙන් අහන්නේ.

<u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමිය, 2016 ඉල්ලපු එකට ඉල්ලපු වර්ෂයට අපි දිලා 2017 එයා පටන් අරගෙන එයා ඉල්ලනවානම් අපෙන් 2020 2021 ඔන කියලා දෙනවා. ඉල්ලපු නැති අයට දේන්නේ නැහැ.ඔක්කොම අයට මේක දෙන්නේ නැහැ.අපි කියමු රන්දිය හෝටලය කියලා උදාහරණයකට කිව්වේ අපේ යාලුවෙක් නිසා එකපාරටම මේක ගන්න පුලුවන් රන්දිය හොටලය අපේන් ඉල්ලන් නැත්නම් අපි මේක වැහුවේ නැහැ අපි ගිහින් බලෙන් දෙන්නැ සහනය ඉල්ලන එවාට විතරයි දෙන්නේ.

<u>**මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමණි, අලුත් අවුරුද්දක් කවුරුත් සතුටින් විසිර යනඑක හොදයි.ඔබතුමාගේ වයස හොදත් නැහැ මගේ වයස හොදත් නැහැ.ලේ රත්කර ගන්න ඔනෙත් නැහැ.නමුත් කිවයුතුයි වියදම් පැත්තේදි ආදායම් පැත්තේදි සැලකිය යුතු අර්බුද ප්‍රමාණයක් අදායම් පැත්තේ පෙන්වනවා.එවගේම හැමදාම කිව්වත් වියදම්වල ප්‍රමුඛතාවය අනුව නෙමෙයි අපි මේ වියදම් දරන්නේ.එනිසා ජනතා විමුක්ති පෙරමුණ විධියට ව්‍යාපෘති ලෙස වෙන වෙනම නොගත්තත් අපේ සමස්ථයක් ලෙස ගත්තත් පොදු විරෝධයක් තියෙනවා එනිසා අපි විරුද්ධ වෙනවා හැකි ඉක්මණින් අපි ලිෆ්ට් එක ඉක්මණින් ඉවර කර ගමු.ආසයි ඔබතුමා මේකෙන් ඉහල පහල යනවා බලන්න.ගරු නගරාධිපතිතුමණි සැහෙන සේවකයෝ සංඛ්‍යාවක් බොහොම ඔබේ සම්පතම අය තමයි මට අහුවෙන ප්‍රධානම චෝදනාව තියෙන්නේ ඔබට හිතවත් වගේම යම් බලයක් තියෙන දේශපාලන සුරතල්ලු තමයි ගොඩක් අය වැඩනොකර ගෙවල් වලට වෙලා ඉන්නේ පොත් අත්සන් කරලා.විශාල ප්‍රමාණයක් ඉන්නවා.එ නිසා ප්‍රසිද්ධ රහසක් නම් ඔනනම් නම් හිටගෙන මෙහෙම කියන්නම්.සැලකිලිමත්වෙන්න විශාල පිරිසක් අද පොත් අත්සන් කරලා ගෙවල්වල.සුරතල්ලු විතරක් නෙමෙයි සුරතලියොත් ඉන්නවා.එනිසා වහාම මෙය වළක්වන්න.එනිසා සැහෙන සංඛ්‍යාවක් අපේ ආයතනයේ වැටුප් ගණිමින් අද එගොල්ලන්ට බොහෝම විනෝදයක් වෙලා තියෙන්නේ.මුදල් කමිටුවට ජනතා විමුක්ති පෙරමුණ විදියට අපි විරුද්ධ වෙනවා.

ගරු නගරාධිපතිතුමනි, පහුගිය දවසක හොද වැඩක් කරලා තිබුණා. එකතමයි බොහොම මහන්සිවෙලා වැඩ කරන අපේ සේවකයො ගැන ඔබට ඇගයිමක් තියෙනවා. කසල කළමණාකරනයට මැදිහත් වෙමින් යම් මට්ටමකට හරි මේ ආයතනයට ජාතික මට්ටමේන් හරි යම් අපිට අවස්ථාවක් නිකම් නමක් අපි රන්දගත්තු කසල කලමණාකරනය සදහා මහන්සිවෙච්ච සේවකයෝ හා සෙවකයින්ගේ බිරින්දෑවරු ගෙනල්ලා මොන මොනවාද

කිව්වාලුනේ.හොදයි දැන් එ බිරින්දැවරු ගෙන්නලා අමතර හම්බකරන ගාන කිව්වානේ එතකොට ඔබෙ චෙතනාව වෙන්න පුලුවන් ඔවුන් එච්චර ගානක් ගන්නවා එ ගාන ගෙදර වියදමට ලැබෙනවානම් ගෙදර තියෙන වියපිහදම් ටික යම් ප්‍රමාණයකට සමනය වෙනවා.එ උත්සාහය වෙන්න ඇති ඔබ ගත්තේ.හැබැයි වුනේ එක නෙමෙයි වුනේ පට්ට විදියට ගෙවල්වලට ගිහිල්ලා මාරාගන්න ගත්තා.තිබිච්ච සමගියත් නැතිවුනා මම හිතන්නේ එවා කරනකොට ඊට වැඩිය පොඩ්ඩක් කල්පනා කරලා කරන්න කියන ඉල්ලීම තමයි ගරු නගරාධිපතිතුමණී කියන්නේ.මුදල් කමිටුවට අපි විරුද්ධවෙනවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා</u>**

ගරු නගරාධිපතිතුමණී මුදල් කමිටුවේ අංක 03,24,32 ට අපි නිහඩයි. අංක 11 හා 16 ට විරුද්ධයි අනෙක් එවාට අපි එකගයි.

**<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමණී, මුදල් කමිටුවේ කාරණා ගණනාවක් තියෙනවා අපි එකග නොවෙන කාරනා විශේෂයෙන්ම අංක 03 මෙක අපි මුල සිටම විරුද්ධ වුන කාරණාවක් කැබ්රප් ගෙන්වීම සම්බන්ධව එ කාරණාවට අපි විරුද්ධයි.අංක 11 විරුද්ධයි.ආවරණ අනුමැතියට යටත්ව කරන ලද සියලුම ගෙවීම් අංක 12 ආදායම් පිළිබද සෑහීමට අපිට පත්වෙන්න බැහැ.එනිසා විරුද්ධයි.අංක 14(1-17)දක්වා විරුද්ධයි.අංක 16 විදුලි සෝපානයටත් අපි මුල සිට විරුද්ධයි අංක 17 අපි නිහඩයි.විශේෂයෙන්ම 17 කාරණාවේදි අපේ ආණ්ඩුකාරතුමා පැමිණෙන උත්සවය සම්බන්ධව අපිට ආරාධනා නොකිරීම සම්බන්ධව විරෝධතාවය මේ අවස්ථාවේදි ප්‍රකාශකරනවා.එවගේම අංක 19 අපිට එකග වෙන්න බැහැ.අංක 24(1-20)දක්වා එ බදු ඉවත් කිරිම සම්බන්ධව විශ්වාසනියත්වය පිළිබද ප්‍රශ්ණයක් තියෙනවා.එනිසා අපිට එකගවීමට හැකියාවක් නැහැ.අංක 26 එ ආකාරයෙන්ම අපිට එකග වෙන්න බැහැ.අංක 32(1,2,3) එකගවෙන්න බැහැ.අංක36 ප්‍රමාණවත් තොරතුරු අපිට නැති නිසා අපිට එකගවෙන්න බැහැ.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුමා, බදු සහන ලබා දිපු එවා අපිට නම් කරලා ඔබට කියන්න බැහැ.ඔබතුමන්ලා එකග වුනේ නැහැ කියලා.මොකද ඔබතුමන්ලාට ඡන්දය දිපු කෙනෙක්ද කියලා දන්නේත් නැහැ.අපිට ඔවා කියන්න වෙනවා.අපිත් මේ එකගතාවය ලබාදෙනවා නෙමෙයි මේ මොරටුව බදු ගෙවන ජනතාව ඉල්ලීමක් කරා මෙම ඉල්ලීම කමිටුවක් මගින් බලලා ඔය සහනය දිලා තියෙනවා.ඔබතුමන්ලා ඔකට විරුද්ධවෙනවා කියන එක අපිට කිසි ප්‍රශ්ණයක් නැහැ.

**<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමණී, එ කාරණාවට අපිට සවිස්තරාත්මකව යම් කිසි විදියකට අපිට එනවානම් ඇමුණුමක් හැටියට ව්‍යාපාරය සම්බන්ධව හේතු කාරනත් එක්ක එ හේතුකාරණා සලකලා බලලා අපට එකග වෙන්න පුලුවන්

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුමා, එකගවෙන්න බැහැකියන්න එපා. එක්කො නිහඩයි.එක්කො ප්‍රතික්ෂේපයි එක්කො හරි

**<u>මහ නගර සභා මන්ත්‍රි - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමණි, දැනට අපි එකට විරුද්ධයි එකගවෙන්න බැහැ.ඔබතුමා එන මාසේහරි සවිස්තරාත්මකව එවනවානම් මේ සම්බන්ධව කාරණා ගොනුකරලා ඇමුණුමක් හැටියට අපිට පුලුවන් එවා සමාලෝචනය කරලා

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුමා, කමිටුව නියෝජනය කරන මන්ත්‍රිවරු ඔක්කොම මෙකට එනවා.ආරාධනා කරනවා.එතකොට ඔබතුමන්ලාගේ පක්ෂය මේකට නියොජනය තියෙනවා.අපි මොකද කරන්නේ එන්නේ නැතිවුනාම.

**<u>නියෝජ්‍ය නගරාධිපති - ඩී.සමන්ත සිල්වා මහතා</u>**

ගරු තිසර මන්ත්‍රිතුමා , බදු සහන කමිටුවේ ඒ ස්ථානවලට ගිහිල්ලා පරික්ෂාකරලා එවකවානුව තුල එයාලා ව්‍යාපාර කටයුතු සිදුවෙන්නැතිබව තහවුරු කරගෙන තමයි අපි මේ බදු සහනය දෙන්නේ.එවගේම නිළධාරින් යනවා මන්ත්‍රිවරුන්ටත් යන්න පුලුවන් මන්ත්‍රිවරුත් ස්ථාන පරික්ෂාවට ගිහිල්ලා බදු සහන කමිටුවට යනවා. බදු සහන කමිටුවේදි බදු සහන දිය යුතුනම් එ කාල වකවානුවට දෙනවා.එක පවත්වාගෙන යන්නැතිතාක්කල් එගෝල්ලෝ ඉල්ලන කාලසිමාවට දෙනවා.නිවැරදි ක්‍රමවේදයක් උපයෝගිකරගෙන තමයි කරේ

**<u>මහ නගර සභා මන්ත්‍රි - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමණි, නිවැරදි ක්‍රමවේදය අනුගමනය කරනවානම් ප්‍රශ්ණයක් නැහැ.තවදුරටත් සවිස්ථරාත්මකව විස්තරයක් සහිතව මේ පිළිබදව අපිට ලැබෙනවානම් ඇමුණුම හැටියට ලබාදෙන්න කියලා

**<u>නියෝජ්‍ය නගරාධිපති - ඩී.සමන්ත සිල්වා මහතා</u>**

ගරු තිසර මන්තිතුමා, බදු සහන කමිටුවේ ඔබතුමාලාගේ පක්ෂය නියොජනය කරන මන්ත්‍රිවරයා එතන නියොජනය කරනවානේ එතුමාට ඔය ප්‍රශ්ණ ටික අහලා නිවැරදිතාවය තහවුරු කරගන්න පුලුවන්.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුමා, පාර්ලිමේන්තු ගියා කියලා පාර්ලිමේන්තු මන්ත්‍රිවරු ඔක්කොම කාරක සභාවල ඉන්නේ නැහැ.ඔබතුමාගේ මන්ත්‍රිවරයෙක් ඉන්නවා මේ කමිටුවේ එ ඉන්නකොට ඔබතුමන්ලා දෙපැත්තට ගියා කියලා අපි පලි නැහැ.සභාවේ විරුද්ධවිමත් එක්ක අපි මේ සහනය දිලා තියෙන්නේ අපේ වුවමනාවට නෙමෙයි.අපි මේ නම් හොයලා ගිහිල්ලාම කියනවා ඔබතුමාලා විරුද්ධ වුනා කියලා.

**<u>මහ නගර සභා මන්ත්‍රි - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමණි, අංක 36, 37ට අපි නිහඩයි .

2021.12.13 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු තිරණයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.

| | | | |
|---|---|---|---|
| 01 | නගරාධිපති | - | ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 02 | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 03 | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 04 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 05 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 06 | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ප්‍රදී ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 07 | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 08 | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා |
| 09 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ඩබ්.ඩී.රන්දු නිරෝෂණ මහතා |
| 10 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 11 | මහා නගර සභා මන්ත්‍රී | - | පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 12 | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 13 | මහා නගර සභා මන්ත්‍රී | - | පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 14 | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 15 | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා |
| 16 | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ලලිත් ප්‍රනාන්දු මහතා |
| 17 | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 18 | මහා නගර සභා මන්ත්‍රී | - | එෆ්.බී.නිලංක සිල්වා මහතා |
| 19 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කේ.පී සුසන්ත පෙරේරා මහතා |
| 20 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 21 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කුමාර රාජරත්න මහතා |
| 22 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.පිලිප් ෆැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 23 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 24 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 25 | මහා නගර සභා මන්ත්‍රී | - | එච්. උජිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා |
| 26 | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.දීපා චාන්දනී ආරියවංශ මහත්මිය |

2021.12.13 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 11, අංක 16 ට තිරණයන්ට විරුද්ධවත් අංක 3, 24, 32 තීරණයන්ට නිහඬවත්, අනෙකුත් සියලු කමිටු තිරණයන්ට පක්ෂවත් පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.

| | | | |
|---|---|---|---|
| 01 | මහා නගර සභා මන්ත්‍රී | - | රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා |
| 02 | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 03 | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 04 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍ර ගාමිණී පීරිස් මහතා |
| 05 | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.එම්.ඒ.දෝන දිලාශිනී මහත්මිය |
| 06 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුදර්ශණී පියන්තිකා කුරේ මහත්මිය |
| 07 | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසිනා බක්කර් මහත්මිය |

2021.12.13 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ.අංක 11,12,14(1) සිට 14(10) දක්වාත්, අංක 16, 19, 24(1) සිට 24(20) දක්වාත්, අංක 26, අංක 32(1), 32(2), 32(3) ට තීරණයන්ට විරුද්ධවත්, අංක 17, 36, 37 නිහඬවත්, අනෙකුත් සියලු කමිටු තීරණයන්ට පක්ෂවත් පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.

| | | | |
|---|---|---|---|
| 01 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා |
| 02 | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 03 | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 05. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 06. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය |
| 07. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.ක්‍රිෂනි ප්‍රනාන්දු මහත්මිය |

2021.12.13 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලු කමිටු තීරණයන්ට විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.

| | | | |
|---|---|---|---|
| 01 | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දුමහතා |
| 02 | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 03 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය |
| 04 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |

2021.12.13 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලු කමිටු තීරණයන් වැඩි ඡන්දෙන් සභා සම්මත විය.
(මෙම අවස්ථාවේ පහත නම් සඳහන් මන්ත්‍රීවරු සභාගැබෙහි නොසිටියහ.

| | | | |
|---|---|---|---|
| 01 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.මැක්සි ජේ ප්‍රනාන්දු මහතා |
| 02 | මහා නගර සභා මන්ත්‍රී | - | සුනිල් නන්දසිරි මාසකෝරාල මහතා |
| 03 | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා) |

**07. 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා කාල සීමාවට අදාළව පහත සඳහන් ස්ථාවර කමිටු වලට සාමාජිකයින් පත් කිරීම.**

**07(1)** ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටුවට කමිටු සාමාජිකයින් පත් කිරීම.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මහ නගර සභා මන්ත්‍රීවරුනි පහත නම් සඳහන් මහ නගර සභා මන්ත්‍රීවරු ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටුවට තේරී පත් වී ඇති බව දන්වා සිටිනවා.

| | | | |
|---|---|---|---|
| 01 | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 02 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 03 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 04 | මහා නගර සභා මන්ත්‍රී | - | මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 05 | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 06 | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |

**07(2)** ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුවට කමිටු සාමාජිකයින් පත් කිරීම.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මහ නගර සභා මන්ත්‍රිවරුනි පහත නම් සඳහන් මහ නගර සභා මන්ත්‍රිවරු ඉඩම් හා නගර සංවර්ධනය පිළිබද ස්ථාවර කමිටුවට තේරි පත් වි ඇති බව දන්වා සිටිනවා.

| | | | |
|---|---|---|---|
| 01 | මහා නගර සභා මන්ත්‍රී | - | පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 02 | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා |
| 03 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කුමාර රාජරත්න මහතා |
| 04 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 05 | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.එල්.සේනක දමයන්ත ස සිල්වා මහතා |
| 06 | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.ක්‍රිෂනි ප්‍රනාන්දු මහත්මිය |

**07(3)** මහජන උපයෝගිතා,කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුවට කමිටු සාමාජිකයින් පත් කිරීම

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මහ නගර සභා මන්ත්‍රිවරුනි පහත නම් සඳහන් මහ නගර සභා මන්ත්‍රිවරු මහජන උපයෝගිතා, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබද ස්ථාවර කමිටුවට තේරි පත් වි ඇති බව දන්වා සිටිනවා.

| | | | |
|---|---|---|---|
| 01 | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 02 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 03 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.පිලිප් ෆැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 04 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කේ.පී සුසන්ත පෙරේරා මහතා |
| 05 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය |
| 06 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |

**07(4)** පරිසර,සෞඛ්‍ය හා සනිපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටුවට කමිටු සාමාජිකයින් පත් කිරීම

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මහ නගර සභා මන්ත්‍රිවරුනි පහත නම් සඳහන් මහ නගර සභා මන්ත්‍රිවරු පරිසර,සෞඛ්‍ය හා සනිපාරක්ෂාව පිළිබද ස්ථාවර කමිටුවට තේරි පත් වි ඇති බව දන්වා සිටිනවා.

| | | | |
|---|---|---|---|
| 01 | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ්චි. ප්‍රදිප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 02 | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 03 | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඔසද හර්ෂණ අබේකොන් මහතා |
| 04 | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.ඒම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා |
| 05 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.මැක්සි ජෙ ප්‍රනාන්දු මහතා |
| 06 | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |

**07(5)** ක්‍රිඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුවට කමිටු සාමාජිකයින් පත් කිරීම

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මහ නගර සභා මන්ත්‍රිවරුනි පහත නම් සඳහන් මහ නගර සභා මන්ත්‍රිවරු ක්‍රිඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුවට තේරි පත් වි ඇති බව දන්වා සිටිනවා.

01 මහා නගර සභා මන්ත්‍රී - යු.ලලිත් ප්‍රනාන්දු මහතා
02 මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩි නිශාන්ත ප්‍රදිනාන්දු මහතා
03 මහා නගර සභා මන්ත්‍රී - ජී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා
04 මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩි.අනුර ප්‍රනාන්දු මහතා
05 මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ශ්‍රියාණි හේමලතා ප්‍රනාන්දු මහත්මිය
06 මහා නගර සභා මන්ත්‍රී - ආර්.එම්.එ.දෝන දිලාශිනි මහත්මිය

**07(6)** කර්මාන්ත හා ඉදිකිරිම් පිළිබඳ ස්ථාවර කමිටුවට කමිටු සාමාජිකයින් පත් කිරීම

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මහ නගර සභා මන්ත්‍රිවරුනි පහත නම් සඳහන් මහ නගර සභා මන්ත්‍රිවරු කර්මාන්ත හා ඉදිකිරිම් පිළිබඳ ස්ථාවර කමිටුවට තේරි පත් වි ඇති බව දන්වා සිටිනවා.

01 මහා නගර සභා මන්ත්‍රී - එ.දිපා චාන්දනි ආරියවංශ මහත්මිය
02 මහා නගර සභා මන්ත්‍රී - එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා
03 මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍ර ගාමිණි පිරිස් මහතා
04 මහා නගර සභා මන්ත්‍රී - එෆ්.බි.නිලංක සිල්වා මහතා
05 මහා නගර සභා මන්ත්‍රී - එම්.සුදර්ශණි ප්‍රියන්තිකා කුරේ මහත්මිය
06 මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා

**07(7)** ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමණාකරනය පිළිබඳ ස්ථාවර කමිටුවට කමිටු සාමාජිකයින් පත් කිරීම

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මහ නගර සභා මන්ත්‍රිවරුනි පහත නම් සඳහන් මහ නගර සභා මන්ත්‍රිවරු ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමණාකරනය පිළිබඳ ස්ථාවර කමිටුවට තේරි පත් වි ඇති බව දන්වා සිටිනවා.

01 මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා
02 මහා නගර සභා මන්ත්‍රී - පි.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා
03 මහා නගර සභා මන්ත්‍රී - රවිනාත් ජයශ්‍රි ගුණසේකර මහතා
04 මහා නගර සභා මන්ත්‍රී - යු.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා
05 මහා නගර සභා මන්ත්‍රී - එෆ්.බි.නිලංක සිල්වා මහතා
06 මහා නගර සභා මන්ත්‍රී - බි.සජිත් දුමින්ද පිරිස් මහතා

**07(8)** එලදායිතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටුවට කමිටු සාමාජිකයින් පත් කිරීම

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මහ නගර සභා මන්ත්‍රීවරුනි පහත නම් සදහන් මහ නගර සභා මන්ත්‍රීවරු එලදායිතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටුවට තේරි පත් වි ඇති බව දන්වා සිටිනවා.

| | | | |
|---|---|---|---|
| 01 | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 02 | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.උජිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා |
| 03 | මහා නගර සභා මන්ත්‍රී | - | සුනිල් නන්දසිරි මාසකෝරාල මහතා |
| 04 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා |
| 05 | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 06 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩි.ඩබ්.ඩි.රන්දු නිරෝෂණ මහතා |

**07(9)** මුදල් පිළිබඳ ස්ථාවර කමිටුවට කමිටු සාමාජිකයින් පත් කිරීම

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මහ නගර සභා මන්ත්‍රීවරුනි නිතරගයෙන් නගරාධිපති ලෙස මා තේරිපත්වෙන නිසා ඡන්ද විමසිමක් සිදු කරන්නේ නැහැ. පහත නම් සදහන් මහ නගර සභා මන්ත්‍රීවරු මුදල් පිළිබඳ ස්ථාවර කමිටුවට තේරි පත් වි ඇති බව දන්වා සිටිනවා.

| | | | |
|---|---|---|---|
| 01 | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.බේසර රවින්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 02 | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 03 | මහා නගර සභා මන්ත්‍රී | - | රවිනාත් ජය ශ්‍රී ගුණසේකර මහතා |
| 04 | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩි.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 05 | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඔසද හර්ෂණ අබේකෝන් මහතා |

## 08. 2022 වර්ෂය සදහා මාසික සභා රැස්වීම් හා ස්ථාවර කමිටු සදහා දින නියම කර ගැනිම. (2022.01.01 සිට 2022.12.31 දක්වා.)

# 09 පුද්ගලික ස්භාවයේ කරුණු

## 09(01) මහ නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය

ගරු නගරාධිපතිතුමණි, විශේෂයෙන්ම නගර සභාවේ ප්‍රධානත්වයෙන් ජාතික අයවැයේ ප්‍රමුඛතා හා ග්‍රාමීය සංවර්ධන ප්‍රමුඛතා කියලා එදා වැඩසටහනක් පැවැත්වුවා. එම වැඩසටහන තුලදී අපිට අවස්ථාව ලැබුනේ නැහැ කථා කරන්නවත්. ඉතින් එතනදි අපි යම් කිසි මොරටුව ප්‍රදේශය නියෝජනය කරන නියෝජිතයෝ විදියට මොරටුවට ආවේණිකව තිබෙන යම් කිසි ව්‍යාපෘතින් අලලා අවස්ථා අඩුවෙන් භාවිතා කරමින් මේතන කෘෂිකර්මාන්තය සඳහා තමයි ප්‍රසන්ටේෂන් එක. පැය 04 ක කාලයක් සම්බන්ධවෙන්න අපිට සිද්ධ වුනා. එවගේ අවස්ථාවන්වලදී මම දැකපු කාරණයක් මම කියන්න ඕන එ කාරණය මොකද අපි රටේ ආර්ථිකය අර්බුදකාරි වාතාවරණයක් තුල ඉන්නකොට කිසියම් රජයේ වැඩපිළිවෙලක් කිසියම් ප්‍රදේශයකට එනකොට ප්‍රදේශයට ආවේණික වැඩපිළිවෙලක් විය යුතුයි කියන ස්ථාවරයේ මම ඉන්නවා සහ විශේෂයෙන්ම අපිට එ ප්‍රසන්ටේෂන් එකේන් අදාල තොරතුරුවලට වඩා අපිට අදාල නැති තොරතුරු තමයි එදා ඉදිරිපත් වුනේ කියන එක කියන්න ඕන.මුදල් අමාත්‍යාංශයෙන් ඇවිල්ලා හිටියා. මම එතුමියට එ සම්බන්ධව කථාකරන්න බලාපොරොත්තුවෙන් හිටියා.නමුත් ඉක්මණින් එතුමිය එම ස්ථානයෙන් ගියා. ඉතින් විශේෂයෙන්ම තව කාරණයක් එත් එක්කම කියන්න ඕන වඩුකර්මාන්තය සම්බන්ධයෙන් මොරටුමුල්ල හමුදාමාවත හා තාපසාරාම පාර පිරිස් විශාල වශයෙන් මට දැනුවත් කිරීම් කරලා තියෙනවා තේක්ක දැව සම්බන්ධයෙන් විශාල ප්‍රශ්ණයක් දැනට මතුවෙමින් පවතින බව මොකද අපිට ප්‍රදේශයට ආවේණික ජීවන රටාව ජීවන තත්වය උසස් මට්ටමට ගෙන එමට අවශයනම් තේක්ක දැව වැඩි ප්‍රමාණයක් මොරටුවට රැගෙන එන්න කියන ඉල්ලීම කරන්න කියලා වඩු කාර්මිකයින් පිරිසක් මට ඉල්ලීමක් කරලා තියෙනවා එකට හේතුව තමයි ජීවන තත්වය උසස් මට්ටමකට ගෙන එමට නම් වෙනත් ප්‍රදේශවලට යන තෙක්ක දැව ප්‍රමාණය කිසියම් ප්‍රතිශතයක් ලෙස අඩුකිරීමක් සිදු කරලා එ ප්‍රමාණය වැඩි ප්‍රමාණයක් මොරටුව වෙත රැගෙන එමේ ක්‍රමවේදයක් සකස් කරන්න කියලා නගර සභාව තුලින් ඉල්ලීමක් ඔබතුමාගෙන් ඉල්ලන්න කියලා ජනතාව පවසනවා ඉතින් විශේෂයෙන්ම මේ රටේ ආර්ථික පරිහානියත් එක්ක අපි ඉන්න අවස්ථාවක මොරටුවේ ආර්ථිකය සමස්ථ ආර්ථිකය රැකගන්නට අවශ්‍ය වැඩ පිළිවෙලක් විශේෂයෙන්ම තේක්ක දැව කර්මාන්තය දැව අපනයනය මොරටුවට වැඩි වශයෙන් රැගෙන එම කියන ඉල්ලීම කරන්න ඕනැ.

ගරු නගරාධිපතිතුමනි, පෞද්ගලික ස්භාවයේ කරුණුවලට ඔබතුමාගෙන් ලැබුණු එකම වරප්‍රසාදය මම හිතන්නේ පොත් කට්ටල කිහිපයක් පමණයි වසර 04 පුරාවටම මම හිතනවා මේ වසරේත් පොත් කට්ටල ප්‍රමාණය ලැබේවි කියලා අපිට අදහසක් තියෙනවා. ඉතින් ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමතියි මොකද අපි 04 වෙනි වසර ගෙවලා ඉන්නවා පළාත් පාලන ආයතන පෙබරවාරි මාසයේ විසුරුවා හැරිය හොත් එහෙම නොවුනෙත් ඉදිරි වසර පුරා ඔබතුමා පොඩ්ඩක් සුභසාධනය සම්බන්ධයෙන් විශේෂයෙන් මන්ත්‍රීවරු 48 දෙනාටම කිසියම් ව්‍යාපෘතියක් ආරම්භ කරන්න කියලා පොඩි ඉල්ලීමක් කරන්න කැමතියි මොකද කිසිම ප්‍රතිපාදනයක් නොලැබිච්ච පිරිසක් නාගරික මන්ත්‍රීවරු විදියට ඔබතුමාගෙන් ලැබිලා තියෙන්නේ පොත්කට්ටල 40 පමණයි.වර්ෂ 4 පුරාවටම මේ වසරේ ලැබුණොත් ඉතින් ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමතියි අපිට මන්ත්‍රීවරු විදියට අපේ වරප්‍රසාද භුක්ති විඳින්න අවස්ථාවක් ලැබුනේම නැහැ.ඔබතුමා ඊට අවස්ථාවක් දුන්නේම නැහැ. අපිට ඉතින් ඔබතුමාගෙන් ඉල්ලනවා තව වසරක් ඉදිරියට ඇදිලා තියෙන වේලාවේ අඩුතරමේ මන්ත්‍රීවරු 48 දෙනා වෙනුවෙන් ගමේ සුභසාධනය උදෙසා ප්ලාස්ටික් පුටු50 ගානෙවත් මන්ත්‍රීවරුට දෙන්න ඔබතුමා සුභවාදිව මේ වසරේවත් කටයුතුකරයි කියලා බලාපොරෝත්තුවෙනවා.මේ ඉල්ලීමත් කරනගමන්ම විශේෂයෙන්ම අපේ දැවැන්ත ප්‍රශ්ණය තේක්ක දැව සම්බන්ධව ඔබතුමාගේ විශේෂ අවධානය යොමුකරන ලෙස නැවතත් ඉල්ලා සිටිනවා.

**09(02)** <u>මහ නගර සභා මන්ත්‍රී - එම්. චන්ද්‍ර ගාමිණී පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමණි ඔබතුමාගේ අවධානයට පුංචි ඉල්ලීමක් කරනවා ඇත්තේන්ම අපි උදාහරණයක් ගත්තොත් රවි මන්ත්‍රීතුමාගේ මව පහුගිය කාලේ අභවප්‍රාප්තවෙලා මම දැනගත්තේ නැහැ.පස්සේත් අවමංගල්‍යා දෙකක් සිද්ධවෙලා ඉතින් මම ගෞරවයෙන් ඉල්ලනවා යම් මන්වත්‍රීරයෙක්ගේ හෝ යම් උසස් නිළධාරි මහත්මයෙක්ගේ පෞද්ගලිකව මුහුණදෙන සම්ප ඥාතියෙක්ගේ හෝ අවමංගල්‍යා හෝ කරදරයක් සිද්ධ වූවිට එ මන්ත්‍රීවරුන්ට දැනුම් දිමේ ක්‍රමවේදයක් හදනවානම් හොදයි කියලා.

**09(03)** <u>නියෝජ්‍ය නගරාධිපති - ඩී.සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමණි 2022 වසරේ හෝ නාගරික මන්ත්‍රීවරුගේ රක්ෂණය සම්බන්ධයෙන් මට දැනගන්න කැමතියි දැන් මෙහි වර්තමාන තත්වය

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, අද දිනයෙත් මම කථාකලා. මම හිතන්නේ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්තුමිය මම මෙතන නිසා කෝල්ස් ගන්නත් ඇති. මම හිතන්නේ මේ මාසය අවසානයට පෙර අපිට රක්ෂණය ලැබෙයි.

## 10 <u>ලැබීම් ගෙවීම් පිළිබද මාසික ප්‍රකාශන වැඩ ප්‍රගති වාර්තා</u>

<u>ගරු නගරාධිපති - ඩබ්ලිව් .සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

2021.12.13 දිනැති මුදල් කමිටු වාර්තාවේ අංක 04 යටතේ 2021 නොවැම්බර් මාසයට අදාල මූල්‍ය වාර්තා ඇමුණුම -01 ලෙස ඉදිරිපත් කර ඇත.

<u>ගරු නගරාධිපති - ඩබ්ලිව් .සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු නිශාන්ත ප්‍රදිනාන්දු මන්ත්‍රීතුමාගෙන් තව තවත් සාධාරණ විවේචන බලාපොරොත්තු වෙමින් ලිහිණි මන්ත්‍රීතුමියගෙන් හරවත්වූ ඥානාන්විතවූ වැදගත්වූ කරුණු බලාපොරෝත්තුවෙමින් රවිනාත් ජය ශ්‍රී ගුණසේකර මැතිතුමාගේ නායකත්වයෙන් සැමදාම හරියට හිරිදේ දකින එක තවත් වැඩිවෙමින් තිසර රසාංජන මැන්දිස් ගරු මන්ත්‍රීතුමාගේ තාත්තාගේ ආභාෂය සභාවට ලබාදෙමින් එ කාරණා එකතුකර ගනිමින් නියෝජ්‍ය නගරාධිපතිතුමා මගේ ජෙෂ්ඨ සහෝදර මන්ත්‍රීවරු නිළධාරින්ගේ සියලුම අයගේ එකතුව ඇතිවෙලා අර බලාපොරෝත්තු වුන විදියට වෙනත් විදියට වෙනත් නගරාධිපතිවරයෙක්ව බලාපොරෝත්තුවන වසරක් වෙවා.එ වසරේ ඔබ සමග හොදින් වැඩ කරන්න පුලුවන් වන කාලය උදාවේවා සියලු දෙනාටම බුදුසරණයි! ජේසු පිහිටයි!.

## 11 වෙනත් කරුණු - නැත.

සභාවේ වැඩ කටයුතු මෙතනින් අවසන් විය.

අ.කලේ/ ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු
නගරාධිපති,
මොරටුව මහා නගර සභාව,
මොරටුව.

2022.01.06 දින,
මොරටුව මහා නගර සභා කාර්යාලයේදිය